(අටවැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

**අංක 1(11).]**

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2015 දෙසැම්බර් මස 19 වැනි සෙනසුරාදා**

---

## 2016 ජනවාරි මස 26 වැනි අඟහරුවාදා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

41/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— තිරසර සංවර්ධන හා වනජීවි අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යෝජිත හම්බන්තොට වන අලි කළමනාකරණ රක්ෂිතයේ ඉඩම් බලෙන් අත්පත් කර ගන්නා බවත්;

(ii) එම රක්ෂිතය එළිපෙහෙළි කර ඇති බවත්;

(iii) මෙම රක්ෂිත ප්‍රදේශය තුළ විවිධ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇති බවත්;

(iv) මේ හේතුවෙන් අලි මිනිස් ගැටුම උග්‍ර වී ඇති බවත්;

(v) මෙම වන අලි කළමනාකරණ රක්ෂිතයේ කටයුතු අතරමග නැවතී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) යෝජිත හම්බන්තොට වන අලි කළමනාකරණ රක්ෂිතයේ විශාලත්වය කොපමණද;

(ii) එම රක්ෂිතයේ සීමා මායිම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම රක්ෂිතයේ සිදුවන මානව ක්‍රියාකාරකම් නැවැත්වීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, ඒ කෙසේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

92/'15

ගරු වාසුදේව නානායක්කාර මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) හමුදා සාමාජිකයින්ගේ දරුවන් සඳහා වෙන්වූ පාසල් වෙනම පවත්වාගෙනයාමේ ප්‍රතිපත්තිය එතුමා පිළිගන්නෙහිද?

(ආ) හමුදාවේ පරිත්‍යාගශීලී වූ, නිලධාරීන් හා යුධ භටයන් දෙපිරිසම වෙනුවෙන් විශේෂ වරප්‍රසාද ලබාදීම අවශ්‍ය වුවත්, ඔවුන්ගේ දරුවන්ට වෙනම පාසල් තිබීමෙන් සමාජයේ නව සමාජ ප්‍රභේදයක් මත පහසුකම් ඇති කරනු ලබන බවත් එතුමා තවදුරටත් පිළිගන්නෙහිද?

(ඇ) (i) මෙම පාසල්වල සිටින නිලධාරීන්ගේ දරුවන් හා සාමාන්‍ය සෙබළුන්ගේ දරුවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මෙවැනි පාසල්, අධ්‍යාපන දෙපාර්තමේන්තුව යටතට ගෙන අනෙකුත් දරුවන්ද ඇතුළත් කරගෙන පවත්වාගෙන යාමට අදහස් නොකරන්නේ මන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

180/'15

ගරු (වෛද්‍ය) ඒ. ආර්. ඒ. හෆීස් මහතා,— ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) සුනාමි ව්‍යසනය නිසා දිවයිනේ විවිධ පළාත්වල නිවාස හා දේපළ අහිමි වූ පවුල් ගණනාවක් මේ වනවිටත් අසරණභාවයෙන් පසුවන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) නිවාස අහිමි වී සිටින පුද්ගලයින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් තෝරාගෙන, ඔවුන්ට ස්ථිර නිවාස ලබාදීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට පියවර ගන්නේද;

(ii) ආපදා කළමනාකරණ අමාත්‍යාංශය හා නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය ඒකාබද්ධව එම වැඩපිළිවෙළ ක්‍රියාවට නැංවීම කෙරෙහි අවධානය යොමු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

196/'15

ගරු විජිත හේරත් මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ඒකාබද්ධව තිබූ උතුරු නැගෙනහිර පළාත් සභාව, උතුරු සහ නැගෙනහිර පළාත් සභා ලෙස වෙන්කළ අවස්ථාවේදී, නැගෙනහිර පළාතේ ස්ථිර පදිංචිකරුවන් වූ නිලධාරීන් 270ක් උතුරු පළාත් සභාවට අනුයුක්ත කරන ලද බවත්;

(ii) අවුරුදු 7 ක පමණ කාලයක් මෙලෙස පදිංචි ප්‍රදේශයෙන් බැහැරව සේවය කිරීමෙන් එම නිලධාරීන් විශාල අපහසුතාවයන්ට ලක්වී සිටින බවත්;

(iii) මෙම නිලධාරීන් නැගෙනහිර පළාතට ස්ථාන මාරු ලබාගැනීම සඳහා අවස්ථා ගණනාවකදී උත්සාහ කළද එය අසාර්ථක වූ බවත්;

(iv) නිලධාරීන් කීපදෙනෙක් පමණක් බලධාරීන්ගේ සහයෝගය මත ස්ථාන මාරු ලබාගෙන ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) නැගෙනහිර පළාතේ පදිංචිකරුවන් එම පළාත් සභාවේ සේවය කිරීම සඳහා කරන සාධාරණ ඉල්ලීම ඉටුකරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගන්නා ක්‍රියාමාර්ගය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

198/'15

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2006 වසරේදී ශ්‍රී ලංකා නාවික හමුදාවේ විධායක අංශය සඳහා ශිෂ්‍යභට නිලධාරීන් බඳවා ගැනීමේදී ඉල්ලා සිටින ලද අධ්‍යාපන සුදුසුකම් කවරේද;

(ii) ලුතිනන් වයි. කේ. රාජපක්ෂ NRX 2431ට තිබූ අධ්‍යාපන සුදුසුකම් කවරේද;

(iii) නියමිත සුදුසුකම්වලින් බැහැරව ඔහු බඳවා ගැනීමට තිබූ විශේෂ හේතුව කවරේද;

(iv) ඒ සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ අනුමතිය ලබා ගත්තේද;

(v) ඔහු නාවික හමුදාවට බැඳුනු දිනය සහ පුහුණුව අවසන් කළ දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙතෙක් ඔහුට හිමි වූ විදේශ ශිෂ්‍යත්ව හා පුහුණුවීම්, විදේශ ගතවූ කාලය, රට සහ රජය වියදම් කළ මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) 2007 වසරේදී ඩාට්මත්හි බ්‍රිතාන්‍ය රාජකීය නාවික විද්‍යාලයේ පුහුණුව සඳහා ඔහු තෝරා ගැනීමට හේතු කවරේද; එය බ්‍රිතාන්‍ය රජය ලබා දුන් ශිෂ්‍යත්වයක්ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ලුතිනන් රාජපක්ෂට එල්ලවී ඇති චෝදනා විමර්ශනය කළ නාවික හමුදා ත්‍රිපුද්ගල කමිටු වාර්තාවට අනුව ඔහුට හා අදාළ වෙනත් පුද්ගලයන්ට එරෙහිව ගනු ලැබූ විනය ක්‍රියාමාර්ග කවරේද;

(ii) එසේ නොමැති නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම් , ඒ මන්ද?

206/'15

ගරු හේෂා විතානගේ මහතා,— කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ වතු ආශ්‍රිතව ජීවත්වන දමිළ ජනතාව පිළිබඳව සහ වතු ආශ්‍රිත ලයින් කාමර පිළිබඳව සමීක්ෂණයක් සිදුකර තිබේද;

(ii) එසේ නම්, වතු ආශ්‍රිත නිවාස, ලයින් කාමර හා ඒ ආශ්‍රිතව ජීවත්වන ජන සංඛ්‍යාව කොපමණද;

(iii) එහි පාසල් යන වයසේ දරුවන් සංඛ්‍යාව සහ ඒ අතරින් පාසල් නොයන දරුවන් සංඛ්‍යාව කොපමණද;

(iv) විදුලිබල පහසුකම් හා සනීපාරක්ෂක පහසුකම් නොමැති පවුල් ඒකක සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වතු ආශ්‍රිතව ජීවත්වන දමිළ ජනතාවගේ ජන ජීවිතය ඉහළ නැංවීම සඳහා වැඩපිළිවෙළක් දියත් කරන්නේද;

(ii) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

(iii) වතු ආශ්‍රිත ජනතාවගේ ලයින් කාමර මුල්කරගත් ජීවිතය නිමාකර ඔවුන් විධිමත් නිවාස තුළ පදිංචි කිරීමේ වැඩපිළිවෙළක් තිබේද;

(iv) එසේ නම්, එම වැඩපිළිවෙළ නිම කිරීමට බලාපොරොත්තු වන කාලය කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

208/'15

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ (වකුෆ් අංශයේ) අංක R/768 BT/65 යටතේ ලියාපදිංචි කර ඇති මඩකලපුව, ''ඕඩ්ඩමාවඩි මුජාහිදීන් ජුම්මා පල්ලියට'' අවසන්වරට නීත්‍යානුකූල භාරකරුවන් පත්කරන ලද දිනය සහ එම පත්වීම් කාලය අවසන් වූ දිනය කවරේද;

(ii) දීර්ඝ කාලයක් නීත්‍යානුකූල භාරකරුවන් පත්කිරීමෙන් තොරව පවතින එම පල්ලියේ පරිපාලන කටයුතු විධිමත්ව පවත්වාගෙන යෑමට නොහැකි තත්ත්වයක් උදාවී ඇති බැවින්, නව භාරකාර මණ්ඩලයක් කඩිනමින් පත්කිරීම සඳහා පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

217/'15

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ජ්‍යෙෂ්ඨත්වය අනුව,

(i) ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරුන්ගේ;

(ii) අභියාචනාධිකරණ විනිසුරුවරුන්ගේ;

(iii) මහාධිකරණ විනිසුරුවරුන්ගේ;

(iv) දිසා අධිකරණ හා මහේස්ත්‍රාත් අධිකරණ විනිසුරුවරුන්ගේ;

නාම ලේඛනයක් සහ ඔවුන්ගේ පත්වීමේ දිනයන් හා විශ්‍රාම යාමට නියමිත දිනයන් එතුමා සභාගත කරන්නෙහිද?

(ආ) (i) රාජකාරි නිවාඩු හෝ වැටුප් රහිත නිවාඩු ලබාගෙන විදේශ රාජ්‍යයන්හි විනිසුරුවරුන් ලෙස සේවය කරනු ලබන (2015.11.01 දින දක්වා) ශ්‍රී ලංකාවේ අධිකරණයට අයත් විනිසුරුවරුන් සිටින්නේද;

(ii) එසේ නම්, ඔවුන්ට විදේශ සේවයට යාම සඳහා අධිකරණ සේවා කොමිසමේ අවසරය ලබාදී ඇත්තේ කවර දිනයක සිටද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

231/'15

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2011 වසරේදී ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස් රථ සඳහා අමතර කොටස් සපයනු ලැබූ සමාගම් කවරේද;

(ii) අදාළ සමාගම් තෝරා ගැනීම සඳහා ටෙන්ඩර් මණ්ඩල අනුමතිය ලබා දී තිබුනේද;

(iii) එසේ තෝරාගත් සමාගම්වල එවකට අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ නම් කවරේද;

(iv) 2011 වසරේ ශ්‍රී ලංගම සභාපතිවරයා සහ ශ්‍රී ලංගම බස් රථ අමතර කොටස් මිලදී ගත් සමාගමේ අයිතිකරු අතර පවතින ඥාති සම්බන්ධය කවරේද;

(v) බස් රථ අමතර කොටස් සැපයීම සඳහා ලියාපදිංචි කළ නියෝජිත සමාගම් සිටියදී, ඊට පරිබාහිර සමාගමකට අදාළ ටෙන්ඩරය ලබාදීමට හේතු වූ කරුණු කවරේද;

(vi) එසේ අවිධිමත් ලෙස තෝරා ගත් සමාගම සඳහා තීරුබදු සහන ලබාදී ඇති බව පිළිගන්නේද;

(vii) එම තීරුබදු සහනය උපයෝගී කර ගනිමින් ගෙන්වන ලද බස් රථ අමතර කොටස් ශ්‍රී ලංගමට සුළු වශයෙන්ද, පංචිකාවත්තේ වෙළඳුන්ට විශාල වශයෙන්ද සපයමින් අයුතු ලෙස ආදායම් ඉපැයීම සම්බන්ධයෙන් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය මගින් පවත්වාගෙන යනු ලබන විමර්ශනයේ වත්මන් ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

252/’15

ගරු බිමල් රත්නායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2011, 2012, 2013 සහ 2014 වර්ෂයන්හිදී සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදල සඳහා ලියාපදිංචි වී ඇති සේවකයන් සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

258/’15

ගරු ජයන්ත සමරවීර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2015 ජනාධිපතිවරණයේදී ජනාධිපති ධූර අපේක්ෂක වර්තමාන ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ‘මෛත්‍රීපාලනයක් සිය දිනකින් අලුත් රටක්’ නමැති වැඩසටහනේ අංක 35 යටතේ, ණය තොරතුරු කාර්යාංශයේ (CRIB) අසාධු ලේඛනයට ඇතුළත්ව ණය උගුලේ හිරවී ඇති සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයින් හා ක්‍රෙඩිට් කාඩ්පත් හිමියන් ඉන් මුදවා ගෙන ලිහිල් කොන්දේසි සහිතව ණය ගෙවීමට අවස්ථාවක් සලසා දෙන බවට පොරොන්දුවක් ලබා දී තිබූ බව එතුමා දන්නෙහිද?

(ආ) 2015.11.01 දින වනවිට එම වැඩසටහන යටතේ සහන ලබා දී ඇති සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් සහ ක්‍රෙඩිට් කාඩ්පත් හිමියන් සංඛ්‍යාව එක් එක් බැංකුව අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) එම වැඩසටහන යටතේ ලිහිල් කොන්දේසි මත ණය ගෙවීමට අවස්ථාව සලසා දුන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ගේ හා ක්‍රෙඩිට් කාඩ්පත් හිමියන්ගේ නම්, ලිපිනය සහ ලබාගෙන තිබූ ණය මුදල පිළිබඳ විස්තර වාර්තාවක් සභාගත කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

270/’15

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නාවික හමුදා දක්ෂිණ මූලස්ථානයේ අවි ගබඩාවක වාණිජ නැව් වලට ආරක්ෂාව සපයන මුහුදු ආරක්ෂකයින්ගේ අවි තැන්පත් කිරීම සිදු කළ කාලවකවානුව කවරේද;

(ii) එකී කාලවකවානුව තුළ එකී කටයුත්තෙන් නාවික හමුදාව ලැබූ ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ගාලු වරායට ඔබ්බෙන් ජාත්‍යන්තර මුහුදේ ඇවන්ට්ගාඩ් සමාගම විසින් පාවෙන අවි ගබඩාවක් පවත්වා ගෙන ගිය කාලවකවානුව කවරේද;

(ii) එකී කාලවකවානුව තුළ එම කටයුත්තෙන් නාවික හමුදාව සහ සී/ස රක්නා ආරක්ෂණ ලංකා සමාගම ලැබූ ආදායම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) පාවෙන අවි ගබඩාවක් පවත්වා ගෙන යෑම, ඇවන්ට්ගාඩ් සමාගමෙන් නාවික හමුදාවට පවරා තිබේද;

(ii) එසේ නම්, එම සමාගම යම් නීතියක් උල්ලංඝණය කළ බවට අධිකරණයකින් ඔප්පු වී තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

279/’15

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) චීනය සමඟ මිතුරු නගර ලෙස සංවර්ධනය වී ඇති, ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) අදාළ නගරවල නම් කවරේද;

(iii) එම එක් එක් නගරය මේ හරහා ලබාගෙන තිබෙන ප්‍රතිලාභ වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) මිතුරු නගර ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන වෙතින් චීන රජයේ පළාත් පාලන ආයතන ලබාගෙන ඇති ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා මේ සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

54/’15

ගරු බුද්ධික පතිරණ මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හම්බන්තොට වරාය පරිශ්‍රය තුළ සීනි සේදීමේ කර්මාන්තශාලාවක් ආරම්භ කිරීමට රජය අවසර දී තිබේද;

(ii) එසේ නම්, එම ආයතනයේ නම හා විදේශීය ආයතනයක් නම්, එම රට කවරේද;

(iii) එම සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නම්, ලිපින හා දුරකථන අංක කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සමාගම ආයෝජනය කරනු ලබන මුදල කොපමණද;

(ii) රජය විසින් එම සමාගමට ලබා දෙන සහන කවරේද;

(iii) සීනි සේදීමේ කර්මාන්තශාලාව ආරම්භ කිරීම මගින් මෙරටට සැලසෙන වාසි කවරේද;

(iv) මෙම කර්මාන්තශාලාව මගින් වසරකට පිරිපහදු කිරීමට බලාපොරොත්තු වන සීනි ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම කර්මාන්තශාලාව නිසා ශ්‍රී ලංකාවේ සීනි කර්මාන්තය බිඳවැටීම වළක්වා ගැනීමට රජය පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

239/'15

ගරු විමලවීර දිසානායක මහතා,— රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට— (2)

(අ) (i) රුපියල් ලක්ෂ දෙකකට හෝ ඊට අඩු මුදලකට බැංකුවලට උකසට තබා ඇති, රන් භාණ්ඩ බේරා ගැනීමේදී ජනතාවට සහනයක් ලෙස ඒ සඳහා අය කෙරෙන අධික පොළිය හා දඩ මුදල් කපා හැරීමට රජය ප්‍රතිපත්තිමය තීන්දුවක් ගෙන තිබේ නම්, ඒ සඳහා අදාළ බැංකුවලට යවන ලද චක්‍රලේඛ පිටපත් සභාගත කරන්නේද;

(ii) එක් එක් බැංකුව මගින්, එසේ පොළී හා දඩ මුදල් කපා හැර ඇති, ප්‍රතිලාභීන්ගේ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඒ සඳහා රජය මගින් අදාළ බැංකුවලට මූල්‍ය ප්‍රතිපාදන ලබා දී තිබේද;

(iv) එසේ නම්, එම මුදල් ප්‍රමාණය, එක් එක් බැංකුව අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2016 ජනවාරි මස 27 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

59/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නකල්ස් රක්ෂිතයේ එනසාල් වගා කරන බවත්;

(ii) එමගින් රක්ෂිතයට දැඩි බලපෑම් එල්ල වී ඇති බවත්;

(iii) මාතලේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තු කාර්යාලයේ නිලධාරීන්ට දේශපාලනඥයින්ගෙන් බලපෑම් එල්ල වන බවත්;

(iv) රක්ෂිතයේ විනාශය රටේම පරිසර තුලිතතාවට බලපාන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) රක්ෂිතයේ පවතින අනවසර වගා බිම් ප්‍රමාණය කොපමණද;

(ii) අනවසර වගාකරුවන්ට විරුද්ධව නීතිමය පියවර නොගන්නේ මන්ද;

(iii) රක්ෂිතයට වන හානිය වැළැක්වීමට මේ වනවිට ගෙන ඇති පියවර කවරේද;

(iv) එනසාල් වගාවන් රක්ෂිතයෙන් ඉවත් කිරීමට කටයුතු කරන්නේද;

(v) එසේ නම්, ඒ කවර දිනයකදීද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) රක්ෂිතයේ ජීවත් වන ඒකදේශික සතුන් හා ශාක පිළිබඳ සමීක්ෂණයක් අවසන් වරට සිදු කළ දිනය කවරේද;

(ii) ඒ අනුව රක්ෂිතයේ ජීවත් වන ඒකදේශික ශාක හා සතුන් කවරේද;

(iii) එනසාල් වගාව නිසා ඒකදේශික ශාක හා සතුන්ගේ ගහනය තර්ජනයට ලක්වී ඇති ප්‍රමාණය පිළිබඳ ඇගයීමක් කිරීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, ඒ කවර දිනයකදීද;

(v) එනසාල් වගාව නිසා රක්ෂිතයට සිදු වූ හානිය පිළිබඳ වාර්තාවක් කැඳවීමට පියවර ගන්නේද;

(vi) එසේ නම්, ඒ කවර දිනයකදීද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

210/'15

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කොළඹ-අවිස්සාවේල්ල මාර්ග සංවර්ධන කටයුතු වැල්ලම්පිටිය හන්දියේ සිට අඹතලේ හන්දිය දක්වා මෙතෙක් ක්‍රියාත්මක නොවීම නිසා දිනපතා එම මාර්ගයේ අධික රථවාහන තදබදයක් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) දක්ෂිණ අධිවේගී මාර්ගයෙන්, කඩුවෙල සහ කඩවත හුවමාරුවලින් ඇතුල්වන රථවාහන ද එම මාර්ගය ඔස්සේ කොළඹ නගරයට පිවිසීමට පටන්ගැනීමත් සමඟ රථවාහන තදබදය තවදුරටත් වර්ධනය වෙමින් පවතින බැවින්, උක්ත මාර්ගය පුළුල්කර සංවර්ධනය කිරීමේ කටයුතු කඩිනම් කිරීම සඳහා පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

221/'15

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2015 වර්ෂයේ පස්වැනි ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය සඳහා,

(i) ඉල්ලුම් කරනු ලැබූ සමස්ත ශිෂ්‍ය සංඛ්‍යාව;

(ii) ලකුණු 150 ට වඩා වැඩියෙන් ලබාගත් ශිෂ්‍යයන් සංඛ්‍යාව;

(iii) ලකුණු 70 ට වඩා ලබාගත් ශිෂ්‍යයන් සංඛ්‍යාව;

(iv) ලකුණු 35 ට අඩුවෙන් ලබාගත් ශිෂ්‍යයන් සංඛ්‍යාව;

එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ශිෂ්‍යත්ව විභාගයේ සමත්වීමේ ඉහළම ලකුණු ප්‍රතිශතය සහ පහළම ලකුණු ප්‍රතිශතය ලබාගත් පාසල් 100 අනුපිළිවෙළින් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) 2014 සහ 2015 වර්ෂයන්හීදී ජනප්‍රිය පාසල් සඳහා තෝරාගත් අවම ලකුණු මට්ටම් සහ ඒ අනුව, 2014 සහ 2015 වර්ෂයන්හීදී තෝරාගත් ශිෂ්‍යත්වලාභීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) පසුගිය මැතිවරණ ප්‍රකාශනය තුළින් 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව ශිෂ්‍යාධාරය වැඩි කරන බවට වූ පොරොන්දුව ඉටු කරන්නේද;

(iii) එසේ නම්, ඒ ශිෂ්‍යයන් කොපමණ සංඛ්‍යාවක් සඳහාද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

233/'15

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) SML Frontier Automotives (Pvt.) Ltd. ආයතනය විසින් පොදුරාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක සමුළුව සඳහා ලෑන්ඩ් රෝවර් ඩිෆෙන්ඩර් රථ සපයා තිබේද;

(ii) එසේ නම්, සැපයූ රථ සංඛ්‍යාව සහ එම රථවල මුළු වටිනාකම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ලෑන්ඩ් රෝවර් රථ අළෙවිය සඳහා මෙරට සිටින නියෝජිතයින් කවුරුන්ද;

(ii) ලෑන්ඩ් රෝවර් රථ මිලදී ගැනීමේදී, සැපයුම්කරු තෝරා ගැනීම සඳහා අනුගමනය කළ ප්‍රසම්පාදන ක්‍රමවේදය කවරේද;

(iii) මෙම රථ මිලදී ගැනීමේදී, ශ්‍රී ලංකා රජය විසින් ණයවර ලිපි විවෘත කර තිබේ නම්, ඒ කවර ආයතනයක් වෙනුවෙන්ද;

(iv) එම ආයතයනය ලෑන්ඩ් රෝවර් රථ නිෂ්පාදකයාද;

(v) එසේ නොවන්නේ නම්, එම ආයතනයේ නම කවරේද;

(vi) SML Frontier Automotives (Pvt.) Ltd. ආයතනයේ හිමිකරුවන්ගේ සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ නම් කවරේද;

(vii) මෙම වාහන මිලදී ගැනීමේදී සිදු වූ මූල්‍ය අක්‍රමිකතාවයන් සම්බන්ධයෙන් පොලිස් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසයට ලැබී ඇති පැමිණිල්ලට අදාළ විමර්ශනයේ ප්‍රගතිය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

262/'15

ගරු (වෛද්‍ය) ඒ.ආර්.ඒ.හෆීස් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බදුල්ල දිස්ත්‍රික්කයේ, බදු/මුස්ලිම් මධ්‍ය මහ විදුහලේ (ජාතික පාසල) දීර්ඝ කාලයක සිට භෞතික හා මානව සම්පත් ඌණතා ඇති බවත්;

(ii) මෙම පාසැලේ උසස් පෙළ විද්‍යා හා ගණිත අංශ සඳහා විද්‍යාවේදී ගුරුවරුන්, කලා සහ වාණිජ අංශ සඳහා උපාධිධාරී ගුරුවරුන්, සාමාන්‍ය පෙළ පන්ති සඳහා ගණිත (දෙමළ මාධ්‍ය) ගුරුවරුන්, 1-6 ශ්‍රේණි සඳහා විද්‍යා (ඉංග්‍රීසි මාධ්‍ය) ගුරුවරුන් සඳහා මෙන්ම, අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ තනතුරු සඳහාද පුරප්පාඩු පවතින බවත්;

(iii) පාසල් ඉඩම සඳහා ආරක්ෂක වැටක්, ශ්‍රවණාගාරයක්, පන්ති කාමර සඳහා ගොඩනැගිල්ලක් වැනි භෞතික සම්පත් අවශ්‍යතා පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මෙම පාසල සඳහා භෞතික හා මානව සම්පත් ලබාදීමටත්, "ළඟම පාසල හොඳම පාසල" ව්‍යාපෘතිය යටතේ අංග සම්පූර්ණ විදුහලක් බවට සංවර්ධනය කිරීමටත් එතුමා පියවර ගන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

272/'15

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 ජනාධිපතිවරණයේ දී වත්මන් රජය විසින් ඉදිරිපත් කළ මැතිවරණ ප්‍රකාශනයෙන් රජය විසින් ඉන්ධන මත අය කරන බදු ඉවත් කිරීමට ජනතාවට පොරොන්දු වූ බවත්;

(ii) 2015 ජනවාරි 16 දින, එවකට සිටි විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා විසින් ඉන්ධන මත අය කරන බදු ඉවත් කිරීමට ජනතාවට පොරොන්දු වූ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ ඉවත් කළ බදු වර්ග සහ ඒවායේ ප්‍රමාණයන් කවරේද;

(ii) මේ වනවිට ඉන්ධන මත පවතින බදු වර්ග කවරේද;

(iii) 2015.01.01 දින සිට 2015.09.30 දින දක්වා එක් එක් බදු වර්ගයෙන් ඉපැයූ ආදායම වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම් ඒ මන්ද?

281/'15

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලෝලෙවල් මාර්ගයේ අඹතලේ සිට ඔරුගොඩවත්ත දක්වා කොටස සංවර්ධනය කර නොමැති බවත්;

(ii) අධිවේගී මාර්ගයේ පැමිණ කොට්ටාවේ සිට කොළඹට යෑම සඳහා ගතවන කාලයට වඩා අඩු කාලයකින් මෙම මාර්ගයෙන් කඩුවෙල සිට කොළඹට ළඟා විය හැකි බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මෙම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා,

(i) තිබෙන දුර ප්‍රමාණය කොපමණද;

(ii) ඇති බාධාවන් කවරේද;

(iii) ඇස්තමේන්තු ගතකර තිබේ නම්, ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(iv) අත්පත්කර ගන්නා ඉඩම් වෙනුවෙන් වර්තමාන වෙළඳපොළ වටිනාකම අනුව වන්දි ලබා දෙන්නේද;

(v) ආරම්භ කරන දිනය හා අවසන් කරන දිනය කවරේද;

යන්න එතුමා මේ සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

309/'15

ගරු හේෂා විතානගේ මහතා,— මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ, පිටකොටුව ආසන්නයේ ඉදිකරන ලද පාවෙන වෙළඳසැල් ව්‍යාපෘතිය ක්‍රියාවට නංවනු ලැබූ ආයතනය කවරේද;

(ii) ඒ සඳහා වැයකරන ලද මුදල කොපමණද;

(iii) එම මුදල යොදවන ලද ආයතනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එහි ඉදිකරන ලද මුළු වෙළඳසැල් සංඛ්‍යාව කොපමණද;

(ii) වෙළඳුන් සඳහා පවරන ලද වෙළඳසැල් සංඛ්‍යාව කොපමණද;

(iii) මේ වනවිට වසා දමා ඇති වෙළඳසැල් සංඛ්‍යාව කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එම ව්‍යාපෘතිය මගින් රජය උපයන මාසික දළ ආදායම කොපමණද;

(ii) ව්‍යාපෘතිය මගින් පාඩු ලබන්නේ නම්, එම මාසික පාඩුව කොපමණද;

(iii) මේ වනවිට මෙම ව්‍යාපෘතිය සාර්ථක අයුරින් ක්‍රියාත්මක වන්නේද;

(iv) අසාර්ථක නම්, ඒ සඳහා බලපා ඇති කරුණු කවරේද;

(v) මෙම ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාත්මක කිරීමට යෝජිත වැඩපිළිවෙළක් පවතින්නේද;

(vi) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා තවදුරටත් මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

311/'15

ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2000.11.29 වැනි දින ත්‍රිකුණාමලය ප්‍රදේශයේ මුහුදු සීමාවේදී ත්‍රස්තවාදී ප්‍රහාරයකට ලක් වීමෙන් ''තුෂාරි'' නමැති ධීවර බෝට්ටුව විනාශ වී එහි සිටි ධීවරයින් අතුරුදහන් වූ බවත්;

(ii) මෙම සිදුවීම සත්‍ය බවත්, අදාළ ධීවර කාර්මිකයින්ගේ යැපෙන්නන්ට වන්දි ලබා දීම සුදුසු යැයි ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් ජී. පියසේන මහතා විසින් අංක ධීජදෙ/සැ/02/06 ඩීආර් හා 2003.01.10 දිනැති ලිපිය මගින් පිළිගෙන ඇති බවත්;

(iii) අතුරුදන් වූ ධීවරයින් අතරින් කුමාරගේ දොන් පියරත්න නමැති අය සඳහා මේ වනතෙක් වන්දි මුදලක් හෝ මරණ සහතිකයක් නිකුත් කිරීමට කටයුතුකර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) පියරත්න මහතාගේ වැන්දඹු බිරිඳ වන කේ.එම්. බ්‍රිජට් කාන්ති මහත්මිය විසින් හිටපු ජනාධිපතිතුමාට හා හිටපු අමාත්‍යතුමාට ලිඛිත අභියාචනා ඉදිරිපත් කළත්, ඒ සම්බන්ධයෙන් සාධාරණ පියවරක් නොගැනීම බලවත් අසාධාරණයක් බව පිළිගන්නේද;

(ii) එසේ නම්, ඇයට වන්දි මුදලක් ගෙවීමටත්, මියගිය ස්වාමියාගේ මරණ සහතිකය ලබා දීමටත් පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

315/'15

ගරු විමලවීර දිසානායක මහතා,— නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අම්පාර නගර සභා බලප්‍රදේශයේ, නවගම්පුර ග්‍රාමයේ නිවාස 25ක් ඉදිකිරීමට ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් ඉඩම් කට්ටි 25ක් වෙන් කර දී ඇති බවත්;

(ii) එම ඉඩම් බෙදා දීමේදී, අංක 2008/4 චක්‍රලේඛය හෝ පදිංචියට ඉඩම් ලබාදීමේදී අනුගමනය කළ යුතු වෙනත් ආඥා පනත් හෝ විධිමත් ක්‍රියාපටිපාටි හෝ අනුගමනය කර නොමැති බවත්;

(iii) ඉහත ඉඩම්, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් බෙදා දෙනු ලැබුවද, ඒ සඳහා අම්පාර ප්‍රාදේශීය ලේකම්වරයාගෙන් විධිමත් අනුමතියක් ලබාගෙන නොමැති බවත්;

(iv) බෙදා දෙනු ලැබූ ඉඩම්වල ප්‍රතිලාභීන්ගේ නාම ලේඛනය සැකසීමේදී හෝ නිර්දේශ කිරීමේදී සිදුවූ අසාධාරණ කටයුතු නිසා, නවගම්පුර ගම්මානයේ හා අම්පාර නගරයේ පදිංචියට ඉඩම් කොටසක් නොමැතිව පීඩාවට පත් වී සිටින ජනතාවට අසාධාරණයක් සිදුවූ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) හි සඳහන් සියළු කරුණු සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදු කරන්නේද;

(ii) මෙම ඉඩම් බෙදා දීමේ අසාධාරණ පිළිවෙළ නිසා අම්පාර නගර සහා බලප්‍රදේශයේ අ(iv) හි සඳහන් වන ඉඩම් අහිමි ජනතාවට සිදුවූ අගතිය නිවැරදි කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

322/'15

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2013 හා 2014 වර්ෂවල රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව විසින් මාධ්‍ය සාකච්ඡා හා වෙනත් විශේෂ අවස්ථා සඳහා කෙටි ආහාර ලබාගත් ආයතන කවරේද;

(ii) ඒ සඳහා ටෙන්ඩර් කැඳවීමක් සිදු කරනු ලැබුවේද;

(iii) එම ටෙන්ඩරය සඳහා මිල ගණන් ඉදිරිපත් කළ ආයතන, ඉදිරිපත් කළ මිල ගණන් හා ඉදිරිපත් කළ සේවා ගාස්තු වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම වර්ෂවල කෙටි ආහාර සැපයූ ආයතනයට ගෙවූ සේවා ගාස්තු මුදල සහ ප්‍රතිශතය කොපමණද;

(v) 2015 මැයි 28 සිට එම ආයතනයට ගෙවූ සේවා ගාස්තු මුදල හා ප්‍රතිශතය කොපමණද;

(vi) ඒ අනුව සේවා ගාස්තු ලෙස පමණක් වැඩිපුර ගෙවූ මුදල කොපමණද;

(vii) මෙම ගනුදෙනුවේදී මූල්‍ය වංචාවක් සිදුවී තිබේද;

(viii) එසේ නම්, අදාළ නිලධාරීන්ට එරෙහිව ගනු ලැබූ ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

61/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— විදේශ රැකියා අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) රැකියාව සඳහා විදේශගත වන ශ්‍රී ලාංකිකයන්ට පුහුණුව ලබා දෙන මධ්‍යස්ථාන ගණන කොපමණද;

(ii) එම පුහුණුලාභීන්ට රජයෙන් ගෙවීමක් කරන්නේ නම්, එම මුදල කොපමණද;

(iii) එම පුහුණුලාභීන් රජයට යම් මුදලක් ගෙවිය යුතු නම්, එම මුදල කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උක්ත පුහුණු මධ්‍යස්ථානයන්හි පුහුණුලාභීන්ට ශ්‍රී ලංකාවේ හා ඔවුන් සේවයට යෑමට බලාපොරොත්තු වන රටේ ආගමන විගමන නීති, රේගු නීති සහ විනිමය නීති පිළිබඳ දැනුමක් ලබා දෙන්නේද;

(ii) නොඑසේ නම්, ඒ සඳහා ඉදිරියේදී කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2016 ජනවාරි මස 28 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

62/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— විදේශ රැකියා අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගෘහ සේවය සඳහා විදේශගතවන්නන් භාවිතයට නුසුදුසු සහ භාවිතයෙන් ඉවත් කළ භාණ්ඩ මෙරටට එවන බවත්;

(ii) ඒ සඳහා ඔවුන්ට විශාල මුදලක් වැය කිරීමට සිදුවන බවත්;

(iii) මෙම අබලි ද්‍රව්‍ය අප රටේ පරිසරයට ද ප්‍රශ්නයක් විය හැකි බවත්;

එතුමිය දන්නෙහිද?

(ආ) (i) විදේශ රටවල සිට භාවිතා කරන ලද පැරණි ගෘහභාණ්ඩ ආදිය රට තුළට ඒම වැළැක්වීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

80/'15

ගරු චන්දිම ගමගේ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) පසුගිය දශකයක පමණ කාලය තුළ පුරාවස්තූන් හා නිදන් වස්තූන් බරපතල ලෙස විනාශවීම් හා සොරුන්ගේ ග්‍රහණයට ලක්වීම් පිළිබඳව විවිධ මාධ්‍ය මගින් වාර්තාකර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ සම්බන්ධයෙන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(ii) මාධ්‍ය මගින් වාර්තා වූ සිද්ධීන් හා ලැබුණු පැමිණිලි සම්බන්ධයෙන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් නීතිමය පියවර ගෙන තිබේද;

(iii) එසේ නම්, නීතිමය පියවර ගෙන ඇති සිද්ධීන් හා පැමිණිලි සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම නීතිමය ක්‍රියාමාර්ග තුළින් වැරදිකරුවන් කර ඇති පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(v) මෙවැනි සිද්ධීන් යළි ඇති නොවීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

211/'15

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පසුගිය රජය මගින් ද්විතීය පාසල් 1000ක් සහ ප්‍රාථමික පාසල් 5000ක් සඳහා යටිතල පහසුකම් සැපයීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක ED/3/37/6/147/sub හා 2013.01.11 දිනැති ලිපිය මගින් මහජන නියෝජිතයින්ගෙන් යෝජනා කැඳවන ලද බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඒ අනුව, ද්විතීය පාසල් 1000ක් සංවර්ධනය කිරීමට සමගාමීව, කොළඹ, ගම්පහ, කළුතර, කුරුණෑගල, රත්නපුර, පොළොන්නරුව, අම්පාර, මඩකලපුව, ත්‍රිකුණාමලය, ගාල්ල, මාතර සහ හම්බන්තොට දිස්ත්‍රික්කවලට අයත් දෙමළ මාධ්‍ය මුස්ලිම් ප්‍රාථමික පාසල් සංවර්ධන කිරීම සඳහා ඉදිරිපත් වූ යෝජනා කවරේද;

(ii) එම යෝජනා ඉදිරිපත් කරන ලද මහජන නියෝජිතයින්ගේ නම්, තනතුරු සහ එසේ යෝජනා කරන ලද පාසල් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම යෝජනා අතරින් ක්‍රියාවට නැංවූ වැඩසටහන් කවරේද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) ඒ සඳහා වියදම් කළ මුදල දළ වශයෙන් කොපමණද?

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

234/'15

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 ජනාධිපතිවරණය පාදක කරගනිමින් 2014 වසර අවසානයේ ජනාධිපතිවරණය ප්‍රකාශයට පත්කිරීමෙන් පසුව රුපියල් කෝටි 6 1/2කට ආසන්න මුදලක් වැයකොට කොළඹ කැම්බල් පිටියේ පැවැත්වූ දිවි නැගුම දෙපාර්තමේන්තුවේ ජාතික සම්මේලනය තුළින් මහජන මුදල් අවභාවිතා කර තිබේද;

(ii) මෙම සම්මේලනය සඳහා රු. 63,723,574/-ක් වැය කිරීම සඳහා අනුමතිය ලබා දුන් බලධාරියා කවුරුන්ද; ඔහුට එවැනි අනුමතියක් ලබාදීමට බලය තිබේද;

(iii) සම්මේලනයක් සඳහා මෙතරම් විශාල මුදලක් වැය කිරීමේදී ටෙන්ඩර් පටිපාටීන් අනුගමනය කර තිබේද;

(iv) මෙම මුදල් අවභාවිතය සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු මට්ටමින් යම් පරීක්ෂණයක් සිදු කර තිබේද;

(v) එසේ නම්, එම පරීක්ෂණයේ නිගමනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම මූල්‍ය අවභාවිතය සම්බන්ධයෙන් මූල්‍ය අපරාධ කොට්ඨාසය මගින් සිදු කරනු ලබන විමර්ශනයන්ගේ වත්මන් තත්ත්වය කවරේද;

(ii) දිවි නැගුම දෙපාර්තමේන්තුවට අහිමි වූ රුපියල් කෝටි 06කට අධික මුදල සම්බන්ධයෙන් වගකිවයුතු පුද්ගලයින් කවුරුන්ද;

(iii) එම මුදල අයකර ගැනීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

263/'15

ගරු (වෛද්‍ය) ඒ.ආර්.ඒ.හෆීස් මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බදුල්ල, මහියංගණය පාර, අංක 93/1 ඒ දරන ස්ථානයේ පදිංචි එන්. ඒ. අසීස් මහතා, වැලිමඩවත්තේ, හද්දවුල කොටසේ පදිංචියට සහ ගොවිපළක් පවත්වාගෙන යෑම සඳහා ඉඩම් කැබැල්ලක් අයදුම් කරන ලද බවත්;

(ii) එම ඉඩම සම්බන්ධයෙන් පැවති නඩු විභාගයක් නිසා ඔහුගේ අයදුම්පත්‍රය පසුව සලකා බැලීමට බදුල්ල දිස්ත්‍රික් ඉඩම් ප්‍රතිසංස්කරණ බලමණ්ඩලය තීරණය කරන ලද බවත් (යොමු අංකය ඉ/ඉ/බ/01 හා 2002/09/05);

එතුමා දන්නෙහිද?

(ආ) එම නඩු විභාගය අවසන් වී තිබෙන බැවින්, අසීස් මහතාගේ ඉල්ලීම නැවත සලකා බැලීම සඳහා අදාළ අංශය වෙත උපදෙස් දෙන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

273/'15

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික ආරක්ෂාවට සහ ප්‍රජාතන්ත්‍රවාදයට අනතුරක් බැවින් 2015 ජනවාරි 08 දින රාත්‍රියේ ජනාධිපතිවරණ ප්‍රතිඵල අත්හිටුවීමේ කුමන්ත්‍රණයක් සම්බන්ධයෙන් ප්‍රමුඛතා පදනමින් විමර්ශනය කරන මෙන් ඉල්ලමින්, විදේශ අමාත්‍ය මංගල සමරවීර මහතා විසින් 2015.01.14 දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිල්ලක් ඉදිරිපත් කළ බව එතුමා දන්නේද;

(ii) එකී විමර්ශන කටයුතු පිළිබඳ වාර්තාව, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් නීතිපති දෙපාර්තමේන්තුවට යොමු කළ දිනය කවරේද;

(iii) එකී විමර්ශන පිළිබඳ නීතිපති මතය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට යොමු කළ දිනය කවරේද;

(iv) එම පැමිණිල්ල පිළිබඳව ගනු ලබන ඉදිරි ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම් ඒ මන්ද?

282/'15

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළොන්නාව ප්‍රදේශය, මත්කුඩු බෙදා හැරීමේ මධ්‍යස්ථානයක් බව පිළිගන්නේද;

(ii) එසේ නම්, මසකට මෙම ප්‍රදේශය හරහා බෙදා හැරෙන මත්කුඩුවල වටිනාකම තක්සේරුකර තිබේද;

(iii) කොළොන්නාව ප්‍රදේශය කේන්ද්‍ර කර ගනිමින් සිදුවන මත්කුඩු බෙදා හැරීම නැවැත්වීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(iv) ඒ සඳහා ගත විය හැකි කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

312/'15

ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා,— බුද්ධශාසන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මොණරාගල දිස්ත්‍රික්කය තුළ පිහිටි රුහුණු මහා කතරගම දේවාලයට අයත් ඉඩම් අක්කර ප්‍රමාණය කොපමණද;

(ii) ඒ අතරින් පුද්ගලයින් අතර බෙදා දී තිබෙන ඉඩම් අක්කර ප්‍රමාණය කොපමණද;

(iii) එම ඉඩම් ලබා දුන් අයගේ නම් හා ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දේවාලයට අයිති ඉඩම් මහා පරිමාණයෙන් ව්‍යාපාරිකයින්ට ලබාදීමෙන් හේන් ගොවිතැනින් ජීවත් වන ගොවීන්ට ගොවිතැන් කටයුතු කිරීමට ඇති අයිතිය අහිමි වන බව පිළිගන්නේද;

(ii) එම ගොවීන්ට වගා කිරීම සඳහා ඉඩම් ලබා දීමට ක්‍රමවේදයක් සකස් කර තිබේද;

(iii) අනාගතයේදී මොණරාගල දිස්ත්‍රික්කයේ ඇති විය හැකි දැඩි ඉඩම් අර්බුදය සැලකිල්ලට ගනිමින් තවදුරටත් මහා පරිමාණයෙන් ව්‍යාපාරිකයන්ට ඉඩම් ලබා දීම අත්හිටුවන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

313/'15

ගරු හේෂා විතානගේ මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රක්වාන, මාදම්පේ මාර්ගය කාපට් කිරීමේ ව්‍යාපෘතිය තුළ අක්‍රමිකතා සිදු වී ඇති බවත්;

(ii) මූලික සැලසුම විශාල වශයෙන් වෙනස් කර ව්‍යාපෘතිය නිම කිරීමට කටයුතු කරන ලද බවත්;

(iii) සාකච්ඡාවක් පවත්වා නැවත මූලික සැලසුම අනුව කටයුතු කිරීමට එකඟ වූ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මූලික සැලසුම විශාල වශයෙන් වෙනස් කර ව්‍යාපෘතිය නිම කිරීමට කටයුතු කිරීම සම්බන්ධයෙන් වගකිවයුත්තන්ට එරෙහිව ගනු ලබන පියවර කවරේද;

(ii) මූලික සැලසුමට අනුව මෙම මාර්ගයේ වැඩ අවසන් කිරීමට අපේක්ෂා කරනු ලබන දිනය කවරේද;

(iii) මෙම ව්‍යාපෘතිය නිසි පරිදි සිදු නොකිරීම හේතුවෙන් අතිරේකව වැය කිරීමට සිදුවන මුදල කොපමණද;

(iv) එම මුදල් වගකිවයුත්තන්ගෙන් අය කර ගැනීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

63/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාව තුළ විද්‍යුත් අපද්‍රව්‍ය විශාල ලෙස මුදා හැර ඇති බවත්;

(ii) එම අපද්‍රව්‍ය වලින් කොටසක් පරිසරයටද අනාරක්ෂිත ලෙස මුදා හැර ඇති බවත්;

(iii) විද්‍යුත් අපද්‍රව්‍ය අනාරක්ෂිත ලෙස පරිසරට මුදා හැරීම පරිසර දූෂණයට ප්‍රධාන සාධකයක් වී ඇති බවත්;

(iv) ජනතාවගේ සෞඛ්‍යයටද විද්‍යුත් අපද්‍රව්‍ය තර්ජනයක් බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාව තුළ වසරකට බැහැර කරනු ලබන විද්‍යුත් අපද්‍රව්‍ය ප්‍රමාණය කොපමණද;

(ii) එම අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් වැඩපිළිවෙළක් තිබේද;

(iii) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

(iv) මේ වනවිට එම වැඩපිළිවෙළ ක්‍රියාත්මක වන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) විද්‍යුත් අපද්‍රව්‍ය මගින් පරිසරයට මුදා හැරෙන රසායන ද්‍රව්‍ය පිළිබඳව පරීක්ෂණයක් සිදු කර තිබේද;

(ii) එසේ නම්, එම පරීක්ෂණය සිදු කළ ආයතනයේ නම සහ එම පරීක්ෂණය සිදු කළ දිනය කවරේද;

(iii) නොඑසේ නම්, ඉදිරියේදී පරීක්ෂණ සිදු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

216/'15

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කැළණිතිස්ස විදුලි බලාගාරයේ සිට කොළොන්නාව (වදුල්ලවත්ත සහ මහබුත්ගමුව ග්‍රාම නිලධාරි වසම) හරහා ඇද තිබෙන අධිබලැති විදුලි රැහැන්වල වෝල්ටීයතාවය කවරේද;

(ii) එම අධිබලැති විදුලි රැහැන් ඇදීමේදී වානේ විදුලි කුළුණු සිටුවීම සඳහා පවරා ගන්නා ලද පෞද්ගලික ඉඩම් කවරේද;

(iii) ඒ සඳහා වන්දි මුදල් ප්‍රදානය කර තිබේද;

(iv) එසේ නම්, එම ඉඩම් හිමියන් ලෙස එවකට හඳුනාගෙන සිටි පුද්ගලයින්ගේ නම්, ලිපිනයන් සහ වන්දි ලෙස ගෙවූ මුදල් ප්‍රමාණය හා වන්දි ගෙවූ දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

283/'15

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සෑම ජාතික පාසලකටම එක හා සමාන ප්‍රතිලාභ ලබා දෙන්නේද;

(ii) එසේ නොවේ නම්, ප්‍රතිලාභ ලබා දීමේ ක්‍රමවේදයක් තිබේද;

(iii) එසේ නම්, එම ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2007 වර්ෂයේදී එවක අධ්‍යාපන අමාත්‍යවරයා විසින් මුල්ගල තබන ලද කොටිකාවත්ත රාජසිංහ විද්‍යාලයේ තෙමහල් ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු අවසන් කරනු ලබන දිනය කවරේද;

(ii) එම පාසලේ පවතින ගුරුවරුන් 13කගේ පමණ ගුරු හිඟය පිරවීමට ගත විය හැකි කාලය කොපමණද;

(iii) එම පාසලේ අබලන් ගොඩනැගිලි නවීකරණය සඳහා පියවර ගන්නේද;

(iv) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) "ළඟම පාසල හොඳම පාසල" යන වැඩපිළිවෙළ කොපමණ කාලයකින් ආරම්භ කරන්නේද;

(ii) ඒ සඳහා සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකින්ම එක හා සමාන පාසල් සංඛ්‍යාවක් තෝරා ගන්නේද;

(iii) එසේ නම්, එම පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම වැඩපිළිවෙළ සෑම ප්‍රදේශයකම සමගාමීව ආරම්භ කරන්නේද;

(v) ප්‍රමුඛතාවය ලබාදෙන ප්‍රදේශ තිබේද;

(vi) එසේ නම්, එම ප්‍රදේශ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2016 පෙබරවාරි මස 09 වැනි අඟහරුවාදා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

69/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉන්දියන් සාගරයේ ජාත්‍යන්තර මුහුදු කලාපයේ මසුන් ඇල්ලීමට චීන යාත්‍රා වලට අවසර ලබා දී තිබේද;

(ii) එසේ නම්, එම අවසරය ලබා දී ඇති යාත්‍රා සංඛ්‍යාව කොපමණද;

(iii) එම යාත්‍රා හා ශ්‍රී ලංකාව අතර ඇති ගිවිසුමට අදාළ බැඳීම් කවරේද;

(iv) මෙලෙස අවසර ලබා දීම තුළින් අපේක්ෂිත වාර්ෂික ආදායම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ජාත්‍යන්තර මුහුදේ මසුන් අල්ලන ශ්‍රී ලාංකික යාත්‍රා සංඛ්‍යාව කොපමණද;

(ii) චීන යාත්‍රා හේතුවෙන් ශ්‍රී ලාංකික ධීවරයින්ට සිදුවන අසාධාරණ මැඩලීමට ගෙන ඇති පියවර කවරේද;

(iii) චීන යාත්‍රා සඳහා අවසර ලබාදීම වෙනුවට ශ්‍රී ලාංකිකයන්ට විශාල ධීවර යාත්‍රා ලබා ගැනීම සඳහා උපකාර නොකිරීමට හේතු කවරේද;

(iv) ශ්‍රී ලාංකිකයන්ට ජාත්‍යන්තර මුහුදේ ධීවර කටයුතු කිරීම සඳහා විශාල ධීවර යාත්‍රා හා නවීන තාක්ෂණික මෙවලම් සමග අවශ්‍ය පහසුකම් ලබා දීමට සැලසුම් කර තිබේද;

(v) එසේ නම්, ඒ කෙසේද; කවර දිනක සිටද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

222/'15

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මාර්ග සංවර්ධන අධිකාරියෙහි අධීක්ෂණය යටතේ අයි - රෝඩ් (i -Road) යනුවෙන් විශේෂ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ව්‍යාපෘතිය සඳහා ණය මුදල් සැපයූ විදේශීය මූල්‍ය ආයතන;

(ii) එම ආයතන සමඟ ණය ගිවිසුම් අත්සන් කළ දිනය;

(iii) ඊට අදාළ කොන්දේසි;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) අයි-රෝඩ් ව්‍යාපෘතිය සඳහා,

(i) තෝරාගත් මාර්ග;

(ii) එකී මාර්ග තෝරාගත් දිනය;

(iii) එක් එක් මාර්ගය ඉදිකිරීමේ කොන්ත්‍රාත් ආයතනය;

(iv) අදාළ ඉදිකිරීම් ආයතන සමග ගිවිසුම්ගත වූ දිනය;

(v) එකී ගිවිසුම්වලට අනුව ඉදිකිරීම් අවසන් කළ යුතු දිනය;

(vi) 2015.11.01 දින වනවිට ඉදිකිරීම් කටයුතු අවසන් කළ මාර්ග;

කවරේද යන්න එක් එක් ප්‍රාදේශීය සභාව අනුව වෙන් වෙන් වශයෙන් එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

236/'15

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2015 ජනාධිපතිවරණය පාදක කර ගනිමින් දිවි නැගුම දෙපාර්තමේන්තුව මගින් මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිවරයාගේ ඡායාරූපය සහිත ලිත් ලක්ෂ 50ක් මුද්‍රණය කොට රුපියල් 29,400,000ක මුදලක් අවභාවිතා කළ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) 2015 වර්ෂය සඳහා සමෘද්ධිලාභී පවුල් ලක්ෂ 18ක් අතර බෙදා හැරීමට ලිත් ලක්ෂ 50 මුද්‍රණය කළ හේතුව කවරේද;

(ii) අදාළ වියදම අනුමත කළ බලධාරියා කවුරුන්ද;

(iii) ඔහුට එම මුදල අනුමත කිරීමේ බලය තිබේද;

(iv) මෙම ලිත් ලක්ෂ 50 මුද්‍රණය කළ ආයතනය කවරේද;

(v) ඒ සඳහා ප්‍රසම්පාදන ක්‍රමවේදයක් අනුගමනය කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) දිවි නැගුම අරමුදලේ මුදල් තම පක්ෂයේ මැතිවරණ ප්‍රවර්ධනයට යොදා ගැනීමෙන් සිදු කර ඇති මූල්‍ය අවභාවිතය සම්බන්ධයෙන් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය මගින් සිදු කරනු ලබන විමර්ශනයේ ප්‍රගතිය කවරේද;

(ii) අදාළ දෙපාර්තමේන්තුව හෝ අමාත්‍යාංශය මගින් මූල්‍ය අවභාවිතය සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කර තිබේද;

(iii) එසේ නම්, එහිදී ගත් විනය ක්‍රියාමාර්ගය කවරේද;

(iv) මේ සඳහා වියදම දරා ඇත්තේ දිවි නැගුම අරමුදලින් නම්, සිදු වූ පාඩුව පියවා ගැනීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

249/'15

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2015.10.15 දින පස්වරුවේ අධික වැසි සහිත කාලගුණයක් පවතිද්දී, මහනුවර කටුගස්තොට ප්‍රදේශයේ අනාරක්ෂිත කාණුවකට වැටීමෙන් මහ / බදියුද්දීන් මහමුද් බාලිකා විදුහලේ උසස් පෙළ පන්තියේ ඉගෙනුම ලැබූ පාතිමා අස්රා ශිෂ්‍යාව මියගිය බව එතුමා දන්නෙහිද?

(ආ) අනපේක්ෂිත ලෙස සිදුවූ අනතුරකින් මියගිය එම ශිෂ්‍යාවගේ ජීවිතය අහිමිවීම නිසා වියෝවට පත්ව සිටින ඇයගේ දෙමව්පියන්ට, වන්දි මුදලක් පිරිනැමීම සඳහා අවශ්‍ය පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

264/'15

ගරු (වෛද්‍ය) ඒ.ආර්.ඒ.හෆීස් මහතා,— බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගම්පොළ, ජයමාලපුර, නාවලපිටිය පාර, අංක 288 දරණ ස්ථානයේ පදිංචි, එම්. ජේ. එම්. අක්බර් මහතාට අයත් නුවරඑළිය, ලෝසන් වීදිය, වරිපනම් අංක 58 දරන ස්ථානයේ පිහිටි අක්බර් ට්‍රේඩර්ස් නමැති ව්‍යාපාරික ස්ථානය 1983 වර්ෂයේ ඇතිවූ ජූලි කලබල අවස්ථාවේ දාමරිකයන් පිරිසක් විසින් ගිනිතබා විනාශයට පත්කරන ලද බවත්;

(ii) එම ව්‍යාපාරික ස්ථානයට සිදුවූ අලාභය සඳහා වන්දි මුදල් ඉල්ලා ඔහු විසින් නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් හරහා (ලිපිගොනු අංක නුඑ/4/3/52 හා 2005/08/17) අදාළ අංශය වෙත යොමු කරන ලද බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) අංක ඒ/ඒ/2342 යටතේ වෙළඳ සමාගමක් ලෙස ලියාපදිංචි වී තිබුන එම ව්‍යාපාරික ස්ථානයට සිදුවූ විනාශය හේතුවෙන් ව්‍යාපාරික කටයුතු මුළුමනින්ම අහිමිවී අසරණභාවයට පත්වී සිටින අක්බර් මහතාට වන්දි මුදල් ගෙවීම ප්‍රමාද වීමට බලපෑ හේතු කවරේද;

(ii) අදාළ වන්දි මුදල් නොපමාව ලබාදීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

276/'15

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2015.01.09 දින සිට 2015.10.31 දින දක්වා කාලවකවානුව තුළ නීතිපතිවරයාගේ උපදෙස් මත,

(i) ඇප ලබා දුන් ත්‍රස්තවාදි සැකකරුවන් සංඛ්‍යාව;

(ii) ඇප ලබා දුන් ත්‍රස්තවාදි විත්තිකරුවන් සංඛ්‍යාව;

(iii) ජනාධිපති සමාව ලබා දුන්, ත්‍රස්තවාදි ක්‍රියාවන්ට වැරදිකරුවන් වූ සංඛ්‍යාව;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

284/'15

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— බුද්ධශාසන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වෙහෙර විහාරස්ථාන සංවර්ධනය කිරීම සඳහා අමාත්‍යාංශය සතු වැඩපිළිවෙළක් තිබේද;

(ii) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

(iii) වෙහෙර විහාරස්ථාන සඳහා මුදල් වෙන් කිරීමේ ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ සිටින දහම් පාසල් ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) දහම් පාසල් ගුරුවරයෙක් සඳහා ගෙවනු ලබන දීමනාව කොපමණද;

(iii) එම මුදල ප්‍රමාණවත්ද;

(iv) එසේ නොවේ නම්, එම මුදල වැඩි කිරීම සඳහා කටයුතු කරන්නේද;

(v) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

314/'15

ගරු හේෂා විතානගේ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඇඹිලිපිටිය, ජනාධිපති විද්‍යාලයේ පළමු වසරට දරුවන් ඇතුළත්කර ගැනීමේදී අක්‍රමිකතා සිදු වී ඇති බවත්;

(ii) විදුහල්පතිවරයා ඒ සඳහා ඍජුවම සම්බන්ධ වී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) මේ සම්බන්ධයෙන් ජාතික පාසැල් අධ්‍යක්ෂ විසින් පරීක්ෂණ පවත්වා තිබේද;

(ii) එසේ නම්, පරීක්ෂණ පැවැත්වූ දිනය කවරේද;

(iii) එම පරීක්ෂණවල ප්‍රතිඵල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) අක්‍රමිකතා සඳහා සම්බන්ධ වී ඇති විදුහල්පතිවරයා සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

(ii) මෙම විදුහලේ අනාගතය වෙනුවෙන් ගන්නා ඉදිරි ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

323/'15

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මෙරට තුළ දැනට හඳුනාගෙන ඇති තැලසීමියා රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම රෝගීන් දිස්ත්‍රික්ක අනුව විසිරී ඇති ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2004.07.02 දින එවකට නියෝජ්‍ය සෞඛ්‍ය අමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශයේ පැවති සාකච්ඡාවකදී ඇටමිදුළු ස්ටෙම් සෛල බද්ධ කිරීමේ මධ්‍යස්ථානයක් කුරුණෑගල ශික්ෂණ රෝහල තුළ ඉදිකිරීමට එකඟ වූ බවත්;

(ii) ඒ සඳහා වයඹ පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් රුපියල් ලක්ෂ 100ක ප්‍රතිපාදන වෙන්කර තිබූ බවත්;

(iii) මෙම ඇටමිදුළු බද්ධය සඳහා පුහුණුව ලැබූ වෛද්‍යවරුන් රජයේ රෝහල්වල සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) මෙරට පෞද්ගලික රෝහලක් තුළ ඇටමිදුළු ස්ටෙම් සෛල බද්ධය සිදුකර තැලසීමියා රෝගීන් සුවපත් කර ඇති බව දන්නේද;

(ii) එසේ නම්, මෙතෙක් ඇටමිදුළු ස්ටෙම් සෛල බද්ධ කිරීමේ මධ්‍යස්ථානයක් කුරුණෑගල ශික්ෂණ රෝහල හෝ රිජ්වේ ආර්යා ළමා රෝහල හෝ වෙනත් රජයේ රෝහලක් තුළ ස්ථාපිත නොකිරීමට හේතුව කවරේද;

(iii) තැලසීමියා රෝගීන් සඳහා දැනට පවතින ප්‍රශස්ත ප්‍රතිකාර ක්‍රමයක් වන ස්ටෙම් සෛල බද්ධය රජයේ රෝහල් තුළ සිදු කිරීම සඳහා ඉදිරියේදී ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

70/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව පුරා ගව කුර හා මුඛ රෝගය ඉතා සීඝ්‍රයෙන් පැතිරෙමින් පවතින බවත්;

(ii) සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සතුව මෙම රෝගය වැළැක්වීමට දිය යුතු එන්නත් ප්‍රමාණවත්ව නොමැති බවත්;

(iii) එම රෝගය පාලනය කිරීම සම්බන්ධයෙන් උක්ත දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ චක්‍රලේඛයේ බොහෝ කරුණු අවලංගු කර තිබෙන බවත්;

(iv) එසේ කිරීම හේතුවෙන් එම රෝගය පාලනය කිරීමට නොහැකි වී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ චක්‍රලේඛයෙන් ඉවත් කළ කරුණු කවරේද;

(ii) එම කරුණු ඉවත් කිරීමට හේතු කවරේද;

(iii) නැවත එම කරුණු ඇතුළත් කිරීමට කටයුතු කරන්නේද;

(iv) ගව කුර හා මුඛ රෝගය පාලනය කිරීමට අවශ්‍ය ඖෂධ හිඟයකින් තොරව ලබා දීමට ගනු ලබන පියවර කවරේද;

(v) එම රෝගය නිසා විනාශ වන ගව සම්පත බෝ කිරීමට ගන්නා කඩිනම් ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2016 පෙබරවාරි මස 10 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

71/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතලේ මහ නගර සභා ප්‍රධාන ගොඩනැගිලි සංකීර්ණයේ සවිකර තිබූ පැරණි අකුණු සන්නායක තුනේ භූගත කම්බි හා මාතලේ නගර මධ්‍යයේ පිහිටි පැරණි ඔරලෝසු කනුවේ ඔරලෝසුවක කොටස් අතුරුදන්වී ඇති බවත්;

(ii) අතුරුදහන්ව ඇති එම කොටස්වල පෞරාණික වටිනාකමක් ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සිදුවීම් සම්බන්ධව පැමිණිලි ලැබී තිබේද;

(ii) එසේ නම්, එම පැමිණිලි ලද දිනයන් කවරේද;

(iii) පැමිණිලි ඉදිරිපත් කළ පුද්ගලයන් කවුරුන්ද;

(iv) එම පැමිණිලි විභාග කළ දිනයන් කවරේද;

(v) එම විභාගයන් සිදු කළ නිලධාරීන් කවුරුන්ද;

(vi) එකී පැමිණිලිවලට සම්බන්ධ චූදිතයන්ට එරෙහිව නීත්‍යානුකූලව ක්‍රියා කර තිබේද;

(vii) එසේ නම්, එම චූදිතයන්ගේ නම්, ලිපිනයන් හා ඔවුන්ට එරෙහිව ගත් ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

223/'15

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂය සඳහා අතුරු අයවැය ඉදිරිපත් කරමින් පෞද්ගලික අංශයේ සේවක සේවිකාවන්ගේ අවම වැටුප රු.2500/- කින් වැඩි කරන බවට ප්‍රකාශ කළ බවත්;

(ii) එහෙත්, 2015 නොවැම්බර් 01 දින දක්වා කිසිදු පෞද්ගලික අංශයේ සේවකයකුට අදාළ රු. 2500/-ක වැටුප් වැඩි කිරීම නොලැබුණු බවත්;

(iii) රාජ්‍ය සේවකයින්ගේ අවම වැටුප රු. 10,000/-කින් වැඩි කිරීම නිසා, 2016 වර්ෂය සඳහා හිඟ වැටුප ද සමග පෞද්ගලික අංශයේ අවම වැටුප රු.5000/-කින් වැඩි විය යුතු බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) 2015.11.01 දිනට ශ්‍රී ලංකාවේ පෞද්ගලික අංශය නියෝජනය කරනු ලබන සමස්ත ශ්‍රමිකයින් සංඛ්‍යාව, ස්ත්‍රී හා පුරුෂ වශයෙන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඔවුන් අතර සේවක අර්ථසාධක අරමුදල සඳහා දායකත්වය නොලැබූ ශ්‍රමිකයන් සිටින්නේද;

(iii) එසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

237/'15

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2011 වසරේදී රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව මගින් චීනයෙන් පාසැල් නිල ඇඳුම් රෙදි ඇනවුම් කිරීමේදී අමාත්‍ය මණ්ඩල අනුමතියට පටහැනිව කටයුතු කිරීමෙන් රජයට රුපියල් මිලියන 24ක පාඩුවක් සිදුවී තිබෙන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) 2010.11.02 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි, අනුමත පාසල් නිල ඇඳුම් රෙදි ප්‍රමාණය කොපමණද;

(ii) අනුමත ප්‍රමාණය ඉක්මවා ලබා ගෙන ඇති රෙදි ප්‍රමාණය සහ වටිනාකම කොපමණද;

(iii) නිල ඇඳුම් රෙදි ආනයනය කිරීමේදී සිදුවී ඇති ප්‍රමාදය හේතුවෙන් රජයට සිදුවූ අලාභය කොපමණද;

(iv) උක්ත අලාභය සඳහා වගකිවයුත්තන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) අදාළ රෙදි මිලට ගැනීමේදී ටෙන්ඩර් මණ්ඩලයට ඉදිරිපත් වූ අවම ටෙන්ඩරය ප්‍රතික්ෂේප කිරීමට හේතු වූ කරුණු කවරේද;

(ii) දෙවන ටෙන්ඩරය තෝරා ගැනීමෙන් රජයට සිදුවී ඇති අලාභය කොපමණද;

(iii) මේ සම්බන්ධයෙන් ටෙන්ඩර් මණ්ඩල නිලධාරීන් සිදු කළ චීන සංචාරයට වැය වූ මුදල කොපමණද;

(iv) 2012.09.30 වනවිට ගබඩා වෙත නොලැබුණු රෙදිවල වටිනාකම කොපමණද;

(v) එම රෙදි සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

250/'15

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උතුරු මැද පළාතේ ද්විතීක පාසැල් 1000 ව්‍යාපෘතියට අයත් කැකිරාව අධ්‍යාපන කලාපයේ, අ/කඩාන්ඩුගම ජායා මුස්ලිම් මහ විදුහල, අනිකුත් දෙමළ මාධ්‍ය පාසැල් අතරින් අ. පො. ස. (උසස් පෙළ) දක්වා පන්ති පැවැත්වෙන එකම දෙමළ මාධ්‍ය විදුහල බව පිළිගන්නේද;

(ii) එසේ නම්, ප්‍රදේශයේ ඇති අනෙකුත් අඩු පහසුකම් සහිත පාසල් දහනවයේ (19) ළමුන්ටද තාක්ෂණ අධ්‍යාපනය හැදෑරීමේ පහසුව සැලකිල්ලට ගෙන, ඉහත පාසල් පරිශ්‍රයේ තාක්ෂණ විද්‍යාගාරයක් ඉදිකිරීම සඳහා උපදෙස් දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

277/'15

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පාසල් නිල ඇඳුම් සඳහා සාමාන්‍යයෙන් වාර්ෂිකව මිල ගණන් කැඳවනු ලබන මාසය කවරේද;

(ii) 2015 වර්ෂය සඳහා මිල ගණන් කැඳවන ලද මාසය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සැපයුම්කරුවන් තීරණය කිරීමේදී, ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්හි 7.9.6 වගන්තිය අනුව දේශීය නිෂ්පාදකයින්ට ලබා දෙන ප්‍රමුඛතාව මෙවර ලබා නොදීමට ඇමති මණ්ඩලය තීරණය කර තිබේද;

(ii) එසේ නම්, එය දේශීය නිෂ්පාදන දිරිගැන්වීමේ රාජ්‍ය ප්‍රතිපත්තියට පටහැනි නොවේද;

(iii) එවැනි තීන්දුවක් ගැනීමට බලපෑ හේතු කවරේද;

(iv) එකී තීන්දුව හේතුවෙන්, දේශීය රෙදි නිෂ්පාදනය ඇන හිටීමෙන් රැකියා අහිමි වීමට සහ විදේශ විනිමය අනවශ්‍ය ලෙස වැය වීමට හැකි බව පිළිගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) 2016 වසර වෙනුවෙන්, පාසල් නිල ඇඳුම් සඳහා රෙදි වෙනුවට මුදල් වවුචර් ලබා දෙන්නේද;

(ii) 2001 වසරේදී පත්වූ රජය මුදල් වවුචර් ලබා දීම ක්‍රියාත්මක කර එය අසාර්ථක ක්‍රමයක් ලෙස තීරණය කර අත් හරිනු ලැබුවේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

285/'15

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුස්ලිම් දේවස්ථාන සංවර්ධනය කිරීම සඳහා අමාත්‍යාංශය සතු වැඩපිළිවෙළක් තිබේද;

(ii) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

(iii) මුස්ලිම් දේවස්ථාන සඳහා මුදල් වෙන් කිරීමේ ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ සිටින මුස්ලිම් දහම් පාසල් ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) දහම් පාසල් ගුරුවරයෙක් සඳහා ගෙවනු ලබන දීමනාව කොපමණද;

(iii) එම මුදල ප්‍රමාණවත්ද;

(iv) එසේ නොවේ නම්, එම මුදල වැඩි කිරීමට කටයුතු කරන්නේද;

(v) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමා මේ සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

290/'15

ගරු (වෛද්‍ය) ඒ. ආර්. ඒ. හෆීස් මහතා,— නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අම්පාර දිස්ත්‍රික්කයේ, දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පහත සඳහන් ලිපිනයන්හි පදිංචිකරුවන් ඉතා අඩු ආදායම්ලාභී ගොවි පවුල්වලට අයත් සාමාජිකයින් බව එතුමා පිළිගන්නෙහිද?

| | | |
|---|---|---|
| (i) | කේ. ජී. චන්ද්‍රසේන මයා | 18, රිදීඇල |
| (ii) | එච්. එම්. ආරියදාස මයා | 12, මහවැලි නිවාස අසල, චන්දනගම |
| (iii) | එම්. එම්. කේ. හේමමාලි මිය | 128/1, තුවාරගල |
| (iv) | කේ. එම්. එම්. මනෝ රංජනී මිය | බඹරවාන |
| (v) | ඒ. ඉන්ද්‍රානි මල්කාන්ති මිය | බඹරවාන |
| (vi) | කේ. එම්. කරුණාරත්න මිය | 209, රන්හෙලගම |
| (vii) | යූ. ජී. සුභාෂිණී මිය | 299/2, තුවාරගල |

(ආ) එසේ නම්, පාසැල් අධ්‍යාපනය හදාරන දරුවන් සමග නොයෙකුත් දුෂ්කරතා මධ්‍යයේ ජීවත්වන ඔවුන්ගේ පැල්පත් නිවාස ප්‍රතිසංස්කරණය කරගැනීම සඳහා නිවාස ආධාර ලබාදීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

324/'15

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාලඹේ SAITM පෞද්ගලික වෛද්‍ය උපාධි ප්‍රදානය කරන ආයතනය ආරම්භ කරනු ලැබූ දිනය කවරේද;

(ii) මේ වනවිට එහි ඉගෙනුම ලබන ශිෂ්‍ය කණ්ඩායම් සංඛ්‍යාව කොපමණද;

(iii) එක් එක් ශිෂ්‍ය කණ්ඩායම්වල සිටින ශිෂ්‍යයින් ගණන වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම ශිෂ්‍යයින් ඉහත කී ආයතනයට සුදුසුකම් ලැබීම සඳහා අ.පො.ස. (උසස් පෙළ) හෝ ඊට සමාන්තර විභාගයක් සමත් වූ වර්ෂය, විෂයධාරාව, එම විභාගයේ ප්‍රතිඵල, "Z" අගය සහ විභාග අංකය එක් එක් ශිෂ්‍යයා අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) එම ආයතනයේ දැනට සිටින ස්ථිර ආචාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ නම්, ඔවුන්ගේ අධ්‍යාපන සුදුසුකම්, ඔවුන් ඉගැන්වීම් කටයුතු කරනු ලබන දෙපාර්තමේන්තු වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2016 පෙබරවාරි මස 11 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

73/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014.05.25 දින කොළඹ වරායට නුදුරු මුහුදෙහි පිහිටි බොර තෙල් ප්‍රවාහනය කරන නළය අබලන් වීම නිසා බොර තෙල් ප්‍රවාහනය කරන නෞකා සඳහා ප්‍රමාද ගාස්තු ගෙවීමට සිදු වූ නැව් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් නෞකාවට ගෙවූ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) නළය අලුත්වැඩියා කිරීමට ගත වූ දින ගණන කොපමණද;

(iv) මේ හේතුවෙන් සපුගස්කන්ද තෙල් පිරිපහදුව සම්පූර්ණයෙන් වසා තැබීමට සිදු වූ දින ගණන කොපමණද;

(v) ඉන්ධන ප්‍රවාහන නළයට සිදු වූ මෙම හානිය හේතුවෙන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට සිදු වූ සමස්ත අලාභය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) බෝයාවට අවශ්‍ය නළ මිලදී ගැනීමට අවසන් වරට ටෙන්ඩර් කැඳවීමක් සිදු කළ දිනය කවරේද;

(ii) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කළ සමාගම් හා එම සමාගම් අයත් රටවල් කවරේද;

(iii) ටෙන්ඩරය ලබාදුන් සමාගම කුමක්ද;

(iv) එම සමාගමට ටෙන්ඩරය ලබා දීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

89/'15

ගරු වාසුදේව නානායක්කාර මහතා,— නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අ.පො.ස. (සා.පෙළ) සමත් තරුණ තරුණියන්, රජයේ හෝ පෞද්ගලික අංශයේ රැකියාවලට බඳවා ගැනීමට ප්‍රථම ඔවුන්ගේ කුසලතාවයන් හා හැකියාවන් මත නොමිලේ ශිල්පීය හෝ වෘත්තීමය පුහුණුවක් ලබාදීම සඳහා දැනට ඇති පහසුකම් ප්‍රමාණවත්ද;

(ii) එසේ නොමැති නම්, පහසුකම් වැඩිකළ යුතු ප්‍රමාණය කවරේද;

(iii) වෘත්තීය හා ශිල්පීය පුහුණුව සඳහා ඇති විෂය මාලාවන් අදට කොතරම් ගැලපේද; එසේ නොමැති නම්, ප්‍රමාණවත්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උක්ත පුහුණුලාභීන් කිසිදු දේශපාලන බලපෑමකින් තොරව, සුදුසුකම් හා හැකියාවන් මත පමණක් රාජ්‍ය හෝ පෞද්ගලික අංශයේ රැකියාවලට බඳවා ගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්තියක් හා සුදුසු ක්‍රමවේදයක් සකසන්නේද;

(ii) රජයේ ඇබෑර්තු සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවීමේදී, පිරවීමට නියමිත තනතුරු සංඛ්‍යාව එම දැන්වීම සමග පළ කිරීමෙන් තරුණ තරුණියන් අනවශ්‍ය අපේක්ෂා භංගත්වයකට පත්වීම වැළැක්විය හැකි බව පිළිගන්නේද;

(iii) එසේ නම්, ඒ සඳහා අවශ්‍ය පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

224/'15

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2013.07.15 වැනි දින උසස් පෙළ විෂය ධාරාව සඳහා තාක්ෂණවේදය නමින් නව විෂය ධාරාවක් හඳුන්වා දුන් බවත්;

(ii) ආරම්භයේදී පාසැල් 252ක ශිෂ්‍යයන් 14,000ක් සඳහා එම විෂය ධාරාව ඇරඹූ බවත්;

(iii) 2016 වසරේ උපාධි පාඨමාලා හැදෑරීම සඳහා තාක්ෂණවේදය විෂය ධාරාව තෝරාගත් ශිෂ්‍යයන් 3000කට ඉඩකඩ ලබාදෙන බවට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව එකඟ වූ බවත්;

(iv) රජයේ විශ්වවිද්‍යාලයන්හි උපාධි පාඨමාලාවන්ට අමතරව ශිෂ්‍යයන් 6000කට ජාතික වෘත්තීය සුදුසුකම් රාමුව (NVQ) යටතේ අධ්‍යාපනය ලබාදීම සඳහා විශ්වවිද්‍යාල විද්‍යායතන (University Colleges) ආරම්භ කළ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) 2014 වර්ෂයේ තාක්ෂණවේදය විෂය ධාරාව ක්‍රියාත්මක වූ පාසැල් සංඛ්‍යාව;

(ii) දෙවැනි කණ්ඩායම ලෙස එම විෂය ධාරාව තෝරාගත් ශිෂ්‍යයන් සංඛ්‍යාව;

(iii) උසස් පෙළ සඳහා තාක්ෂණවේදය හැදෑරූ ශිෂ්‍යයන් අතරින් 2016 වර්ෂයේදී විශ්වවිද්‍යාල සඳහා සහ විශ්වවිද්‍යාල විද්‍යායතන සඳහා ඇතුළත් කරගැනීමට සැලසුම් කරනු ලබන ශිෂ්‍යයන් සංඛ්‍යාව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

227/'15

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සුනාමි විපතින් හානියට පත් තම නිවස සඳහා සහාධිපත්‍ය නිවාසවලින් නිවසක් ලද, ඩබ්. ප්‍රදීප් මහතාගේ දරුවා, 2013 වසරේ මාතර, සුජාතා විද්‍යාලයේ පළමු පන්තියට ඇතුළත් කිරීම සඳහා ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප වී තිබේද;

(ii) එසේ නම්, ඊට අදාළ හේතු කවරේද;

(iii) ඒ සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද අභියාචනය ප්‍රතික්ෂේප වී තිබේද;

(iv) එසේ නම්, ඊට අදාළ හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම ප්‍රතික්ෂේප කිරීම් වලින් පසුව, අදාළ දැරිය පාසලට ඇතුළත් කරගෙන, ඒ බව දැනුම් දෙන ලෙස දන්වා අමාත්‍යාංශ ලේකම් හා ජාතික පාසල් අධ්‍යක්ෂ විසින් විදුහල්පතිවරයා වෙත ලිඛිතව දැනුම් දීමක් සිදු කර තිබේද;

(ii) එසේ නම්, එම ලිඛිත දැනුම් දීම සම්බන්ධයෙන් විදුහල්පතිවරයාගේ ප්‍රතිචාර කවරේද;

(iii) එම ඉල්ලීම ප්‍රතික්ෂේප කර දැරිය පාසලට ඇතුළත් කරගෙන නොමැති බව දන්නේද;

(iv) එම දැරිය පාසලට ඇතුළත්කර නොගැනීමට හේතු කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) එම ප්‍රතික්ෂේප කිරීමට අදාළව විධිමත් පරීක්ෂණයක් සිදු කර තිබේද;

(ii) එම දැරියට සිදු වූ අසාධාරණය සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

267/'15

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මුස්ලිම් පල්ලි හා පුනාායතන දේපළ පනත යටතේ, මුස්ලිම් පල්ලි, ජුම්මා පල්ලි, තක්කියා සාවියා යන ආගමික සිද්ධස්ථානවලට අයත් ඉඩම් සහ ගොඩනැගිලි (වක්ෆ් දේපළ) රජයේ විවිධ සංවර්ධන කටයුතු සඳහා අත්පත් කර ගැනීමේදී, මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව (වක්ෆ් අංශය) දැනුවත් කිරීමෙන් තොරව එම අත්පත් කිරීම් සිදුවන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වක්ෆ් දේපළ, අත්පත්කර ගැනීමේදී අනුගමනය කළයුතු ක්‍රියාපටිපාටි (අදාළ පනත අනුව) සම්බන්ධයෙන් ගැසට් නිවේදනයක් විෂය භාර අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත්කර තිබේද;

(ii) එසේ නම්, එම ගැසට් නිවේදනයේ අංකය හා දිනය කවරේද;

(iii) එහි පිටපතක් සභාගත කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

287/'15

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කොළොන්නාව ප්‍රදේශය හරහා ගමන් කරන්නා වූ මාර්ග අංක 151, 714 සහ 166 සඳහා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය මගින් බස් රථ යොදවා නොමැති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම මාර්ගවල බස්රථ නොමැති වීම නිසා පීඩාවට පත්වන පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) මෙම මාර්ගවල ශ්‍රීලංගම බස්රථ යෙදවීම සඳහා ස්ථිර වැඩපිළිවෙළක් සකසන්නේද;

(iii) එසේ නම්, එම මාර්ගවල ගමනාගමන කටයුතු ආරම්භ කිරීමට ගතවන කාලය කොපමණද;

(iv) එම මාර්ගවලට යොදවන බස් රථවලට පෞද්ගලික මගී ප්‍රවාහකයින්ගෙන් හා අනිකුත් කණ්ඩායම්වලින් එල්ල වන තර්ජන හා පීඩා වැළැක්වීමට වැඩපිළිවෙළක් සකස් කරන්නේද;

යන්න එතුමා මේ සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

291/'15

ගරු (වෛද්‍ය) ඒ. ආර්. ඒ. හෆීස් මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ-නුවර මාර්ගයේ වීදියවත්ත සිට නිට්ටඹුව දක්වා වූ කොටස පුළුල් කිරීමේ ව්‍යාපෘතිය සඳහා කල්එළිය, මස්ජිද් මාවත, අංක 5/1 දරන ස්ථානයේ පදිංචි එම්. ආර්. එම්. මිම්සියාඩ් මහතාට අයත් ගම්/392 කැබලි අංක 164 කොටස රජයට පවරා ගන්නා ලද බවත්;

(ii) එම ඉඩම සඳහා මෙතෙක් වන්දි ප්‍රදානය කර නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) කොළඹ-නුවර ප්‍රධාන මාර්ගයට මුහුණලා පිහිටි, වාණිජමය ප්‍රදේශය හා සම්බන්ධ එම ඉඩම් කැබැල්ල අඩු වටිනාකමට තක්සේරු කිරීමෙන් අසාධාරණයට ලක් වී සිටින මිම්සියාඩ් මහතාට, වර්තමාන තක්සේරු වටිනාකම සැලකිල්ලට ගෙන වන්දි මුදල් ප්‍රදානය කිරීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

302/'15

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉන්දු - ශ්‍රී ලංකා ආර්ථික සහ තාක්ෂණික සහයෝගිතා ගිවිසුමක් අත්සන් තැබීමට ඉන්දියාව සමග රජය සාකච්ඡා කරමින් සිටින්නේද;

(ii) එකී ගිවිසුම අත්සන් තැබීමට බලාපොරොත්තු වන කාලවකවානුව කවරේද;

(iii) එකී ගිවිසුම "සීපා" නමින් හඳුන්වන විස්තීර්ණ ආර්ථික සහයෝගිතා ගිවිසුමෙන් වෙනස් වන ආකාරය කවරේද;

(iv) එකී ගිවිසුම අත්සන් තැබීමට පෙර එහි අන්තර්ගතය පිළිබඳ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, විද්වතුන්, වෘත්තීයවේදීන් සහ ව්‍යාපාරික ප්‍රජාව සමග සාකච්ඡා කරනු ලබන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

74/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවේ ජාතික හැඳුනුම්පතක් නොමැති පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ට ජාතික හැඳුනුම්පතක් නිකුත් කිරීමට ක්‍රියා නොකළේ මන්ද;

(iii) එම පිරිසට ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, ඒ කෙසේද;

(v) එම හැඳුනුම්පත් නිකුත් කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නව විද්‍යුත් ජාතික හැඳුනුම්පතක් නිකුත් කිරීමට රජය කටයුතු කරමින් සිටින්නේද;

(ii) එසේ නම්, වයස අවුරුදු 18 ඉක්මවූ සියලු ශ්‍රී ලාංකික පුරවැසියන්ට හැඳුනුම්පතක් ලබා දීමට එම ක්‍රමය යටතේ හැකිවේද;

(iii) ඒ සඳහා ඇති සැලසුම් කවරේද;

(iv) එම නව ව්‍යාපෘතිය සඳහා වැය කිරීමට බලාපොරොත්තුවන මුදල කොපමණද;

(v) නව හැඳුනුම්පත සඳහා ජනතාවගෙන් මුදලක් අයකරගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

288/'15

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සේවය කරන මැන් පවර් සේවකයින්ගේ සේවය ස්ථිර කරන්නේද;

(ii) මැන් පවර් සේවකයන් අලුතින් බඳවා ගැනීමක් සිදු කරන්නේද;

(iii) එසේ නම්, බඳවා ගැනීමේ ක්‍රමවේදය කවරේද;

(iv) බඳවා ගැනීම් සිදු කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2016 පෙබරවාරි මස 12 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

75/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව සතුව ඇති නොදියුණු තාක්ෂණික උපකරණ මගින් නිවැරදි කාලගුණ අනාවැකි ලබා දීමට අපොහොසත් වී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවට මානව හා දියුණු භෞතික සම්පත් ලබා දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ලබා දීමට බලාපොරොත්තු වන නවීන තාක්ෂණික උපකරණ කවරේද;

(iii) එම නවීන උපකරණ කුමන කටයුතු සඳහා භාවිතා කරන්නේද;

(iv) එම උපකරණ සඳහා වැය වන මුදල කොපමණද;

(v) නවීන තාක්ෂණික උපකරණ ලබා දෙන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

133/'15

ගරු වාසුදේව නානායක්කාර මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) රජයේ විශ්වවිද්‍යාල නොවන ආයතන මගින් පවත්වාගෙන යනු ලබන ඉංජිනේරු, ගණකාධිකාරී හා වෙනත් වෘත්තීයවේදී පාඨමාලා සංඛ්‍යාව ආයතනය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම ආයතන එක් එක් පාඨමාලාව සඳහා අයකරනු ලබන පාඨමාලා ගාස්තුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ආ) (i) උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය යටතේ ඇති විශ්වවිද්‍යාලවල ගාස්තු අයකර පවත්වාගෙන යනු ලබන පාඨමාලා කවරේද;

(ii) එම එක් එක් පාඨමාලාව සඳහා අයකරනු ලබන පාඨමාලා ගාස්තුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) වර්ෂ 2012 සිට 2015 දක්වා එම ගාස්තුවල ඇතිවූ වෙනස්වීම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

220/'15

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2012.01.01 සිට 2015.01.01 දක්වා, ශ්‍රී ලාංකික පුරවැසියන් විසින් රාජ්‍ය බැංකුවලින්,

(i) ලබාගෙන ඇති මුළු උකස් ණය ප්‍රමාණය;

(ii) ස්වර්ණාභරණ උකස් කර ලබාගෙන ඇති ණය ප්‍රමාණය;

(iii) ස්වර්ණාභරණ උකස් කර ණය ලබාගෙන ඇති ස්ත්‍රීන් සහ පුරුෂයින් සංඛ්‍යාව;

එක් එක් බැංකුව අනුව වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ආ) (i) ස්වර්ණාභරණ උකස්කර රුපියල් ලක්ෂ දෙකකට වඩා අඩුවෙන් ණය ලබාගෙන ඇති ස්ත්‍රීන් හා පුරුෂයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම ණය ප්‍රමාණය, ඉහත සඳහන් කාලසීමාව තුළ නිකුත් කර ඇති සමස්ත ණය ප්‍රමාණයෙහි ප්‍රතිශතයක් ලෙස වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

292/'15

ගරු (වෛද්‍ය) ඒ. ආර්. ඒ. හෆීස් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කැකිරාව අධ්‍යාපන කලාපයට අයත්, අ/බමුණුගම මුස්ලිම් විදුහලේ විදුහල්පති ධුරය දරමින් සිටි ඒ. එච්. සමුන් මහතා යම් විනය නියෝගයක් මත විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2:17 වගන්තිය අනුව (යොමු අංක උමැප/අදෙ/07/2/001) විශ්‍රාම ගැන්වීම සඳහා නිර්දේශ කර තිබේද;

(ii) එසේ නම්, ඒ කවර දිනයක සිටද;

(iii) ඒ අනුව ඔහුගේ විශ්‍රාම පාරිතෝෂික මුදල සහ විශ්‍රාම වැටුප ලබා දෙන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

294/'15

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයේ ක්ෂේත්‍ර නිලධාරීන් යතුරුපැදි බෙදා දීමේ වැඩසටහන සඳහා අයදුම් කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඔවුන් අතරින් කිහිප දෙනෙකුට පමණක් යතුරුපැදි ලබා දී තිබෙන්නේද;

(ii) එසේ නම්, තෝරාගත් ක්ෂේත්‍ර නිලධාරීන් කීප දෙනෙකුට පමණක් යතුරුපැදි ලබා දීමට හේතුව කවරේද;

(iii) සෙසු ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා යතුරුපැදි ලබා දෙන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

295/'15

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) සංවර්ධන කටයුතු සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය විසින් වක්ෆ් දේපළක් වන රක්වාන මුහියිද්දීන් ජුම්මා පල්ලියට (ලි.ප. අංක R/236/R09) අයත් ඉඩම් කොටසක් පවරාගෙන තිබෙන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත දේපළ පවරා ගැනීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය, මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ අනුමතිය ලබාගෙන තිබේද;

(ii) එසේ නම්, එම ඉඩම් කොටස සඳහා වන්දි ප්‍රදානය කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

304/'15

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගෝලීය දෙමළ සංසදයේ සභාපති එස්.ජේ. එමානුවෙල් පියනමට ශ්‍රී ලංකාවේ සංචාරයක යෙදීමට ජනාධිපතිතුමා විසින් ආරාධනා කර තිබේද;

(ii) එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ අංක 1373 දරන යෝජනා සම්මුතිය යටතේ ත්‍රස්තවාදීන්ට සහාය දක්වන සංවිධානයක් ලෙස නම් කර, තහනම් කර තිබෙන ගෝලීය දෙමළ සංසදයේ එකී තහනම ආණ්ඩුව විසින් ඉවත් කර තිබේද;

(iii) එසේ තහනම ඉවත් කිරීමට බල පෑ හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ගෝලීය දෙමළ සංසදය, කොටි ත්‍රස්තවාදයට සහය දැක්වීම පිළිබඳ කණගාටුව පළ කිරීමක් හෝ අනාගතයේ දී ත්‍රස්තවාදයට සහාය නොදක්වන බවට ප්‍රතිඥාවක් ලබා දී තිබේද;

(ii) දෙමළ ඊළම නමින් ශ්‍රී ලංකාව තුළ වෙනම රාජ්‍යයක් පිහිටුවීමේ අරමුණින් එස්.ජේ. එමානුවෙල් පියනම ප්‍රකාශිතව ඉවත් වී තිබේද;

(iii) ශ්‍රී ලංකාව තුළ වෙනම රාජ්‍යයක් පිහිටුවීමට ඍජුව හෝ වක්‍රව, ආධාර හෝ අනුබල සැපයීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157අ. ව්‍යවස්ථාව උල්ලංඝණය වන දඬුවම් ලැබිය යුතු වරදක් බව පිළිගන්නේද;

(iv) එවැනි වරදක් කරන පුද්ගලයෙකුට අනුබල දීමත් වරදක් බව පිළිගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

76/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014 වර්ෂයේ දී එප්පාවල පොස්පේට් සමාගම් භූමියේ මීටර් 850 ක මාර්ගයේ කාපට් ඇතිරීමට වැය කළ මුදල කොපමණද;

(ii) එම ව්‍යාපෘතිය ලබාදීම සඳහා ටෙන්ඩර් කැඳවීමක් සිදු කළේද;

(iii) ටෙන්ඩරය ලබා දුන් සමාගම කුමක්ද;

(iv) එම සමාගමට ටෙන්ඩරය ලබාදීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත ව්‍යාපෘතිය සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කළ සමාගම්වල නම්, ලිපින, දුරකථන අංක, අධ්‍යක්ෂ මණ්ඩලයේ නම් හා ටෙන්ඩරයේ වටිනාකම එක් එක් සමාගම අනුව, වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) (i) එප්පාවල පොස්පේට් සමාගම තුළ සිදුවූ දූෂණ හා වංචා පිළිබඳව පරීක්ෂණයක් සිදු කර තිබේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) එම පරීක්ෂණයේ ප්‍රතිඵල කවරේද;

(iv) නොඑසේ නම්, පරීක්ෂණයක් සිදු කිරීමට කටයුතු කරන්නේද;

(v) එසේ නම්, එම දිනය කවරේද;

(vi) එම පරීක්ෂණයේ ප්‍රතිඵල මෙම සභාවට ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

225/'15

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පසුගිය රජයේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් "පාලම් දහස" නමින් විශේෂ ව්‍යාපෘතියක් ආරම්භ කළ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ව්‍යාපෘතිය ආරම්භ කළ දිනය කවරේද;

(ii) තෝරාගත් පාලම් 1000 ප්‍රාදේශීය සභා මට්ටමින් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) අදාළ පාලම් දහස තෝරාගත් ක්‍රමවේදය සහ අදාළ දිනය හා වර්ෂය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) (i) උක්ත ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත මුළු මුදල කොපමණද;

(ii) අදාළ මුදල් ලබාගන්නා දේශීය හා විදේශීය මූල්‍ය ආයතන කවරේද;

(iii) ඒ සඳහා වූ පොළී අනුපාතය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) මෙම පාලම් දහස ඉදිකිරීම සඳහා වගකීම් භාරදුන් ඉදිකිරීම් සමාගම් කවරේද;

(ii) අදාළ සමාගම් හෝ ආයතන සමග ඉදිකිරීමේ ගිවිසුම් අත්සන් කළ දිනයන් සහ අදාළ ගිවිසුම් ප්‍රකාරව ඉදිකිරීම් අවසන් කළ යුතු දිනයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා සභාගත කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

293/'15

ගරු (වෛද්‍ය) ඒ. ආර්. ඒ. හෆීස් මහතා,— බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ, කල්පිටිය, සින්නකුඩියිරුප්පුව, ආනවාසල් පාර ලිපිනයේ පදිංචි එම්. එච්. එම්. සාලි මහතාට අයත් කල්පිටිය, බසාර් වීදියේ පිහිටි, "මවුලානා ටෙක්ස්ටයිල්ස්" වෙළඳ ආයතනය 2002/02/21 දින දාමරිකයින් පිරිසක් විසින් ගිනි තබා විනාශ කරන ලද බවත්;

(ii) ව්‍යාපාරය අහිමි වී අසරණභාවයට පත්ව සිටින සාලි මහතා විසින් වන්දි මුදලක් ලබාගැනීමේ අපේක්ෂාවෙන් තැනැත්තන්, දේපළ හා කර්මාන්ත පුනරුත්ථාපනය කිරීමේ අධිකාරිය වෙත (අංක REP/PV/APP/2002) අයදුම්පත්‍රයක් යොමුකර ඇතත්, මේ දක්වා වන්දි ප්‍රදානය කිරීමක් සිදුවී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) වසර ගණනාවක කාලයක් නොයෙකුත් හේතු කාරණා ඉදිරිපත් කරමින්, එම අයදුම්පත සම්බන්ධයෙන් කල්මැරීමේ ප්‍රවණතාවයක් දක්නට තිබෙන හෙයින්, මේ සම්බන්ධයෙන් සොයා බලා සාලි මහතාට හිමි වන්දි මුදල ලබාදීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

306/'15

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2015 නොවැම්බර් 10 දින හෝ ඊට ආසන්න දිනයකදී ඕස්ට්‍රේලියානු විදේශ ඇමතිනි ජුලී බිෂොප් හමුවූ දෙමළ ජාතික සන්ධානයේ මන්ත්‍රීවරයෙකු ඇතුළු නියෝජිත පිරිසක් ශ්‍රී ලංකාවේ පිහිටුවීමට නියමිත යුද අපරාධ අධිකරණයේ කටයුතු කිරීම සඳහා ඕස්ට්‍රේලියානු විනිසුරුවරුන් එවන මෙන් ඉල්ලා සිටි බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එකී නියෝජිත පිරිස රජයේ යම් විධායක තනතුරු දරන්නේද;

(ii) එම පිරිස ජනාධිපතිවරයාගේ විශේෂ තානාපතිවරුන් හෝ නියෝජිතයින් ලෙස පත් කර තිබේද;

(iii) ශ්‍රී ලංකාව වෙනුවෙන් එවැනි ඉල්ලීමක් කිරීමට ඔවුන්ට ඇති බලය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකා රජයේ ආරාධනයකින් තොරව ඕස්ට්‍රේලියානු විනිසුරුවරුන් මෙරට නඩු කටයුතු සඳහා එවීමට ඕස්ට්‍රේලියානු රජයට යම් බලයක් තිබේද;

(ii) යෝජිත යුද අපරාධ අධිකරණයේ නඩු කටයුතු සඳහා විදේශීය විනිසුරුවරුන්ට ආරාධනා කිරීමට රජය බලාපොරොත්තු වන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2016 පෙබරවාරි මස 23 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

55/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නාගරික පාසල් දරුවන් මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන්ගේ ගොදුරු බවට පත්වී ඇති බවත්;

(ii) මෙම ජාවාරම් පාසල් දරුවන් යොදාගෙන සිදුකරන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ වනවිට මත්ද්‍රව්‍යයන් පාසල් තුළට පිවිසීම නැවැත්වීමට රජය ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) පසුගිය වසර පහ තුළ මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදි සඳහා අත්අඩංගුවට පත් පාසල් ශිෂ්‍යයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන් නැවත සමාජගත කිරීම සඳහා රජය අනුගමනය කරන ක්‍රියාදාමය කවරේද;

(iii) එසේ සමාජගත කළ දරුවන් පිළිබඳ පසු විපරම් කිරීමේ ක්‍රියාවලියක් ක්‍රියාත්මක වන්නේද;

(iv) එසේ නම්, එම ක්‍රියාවලියට සම්බන්ධ පියවරයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

197/’15

ගරු විජිත හේරත් මහතා,— රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2003 වසරේදී ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව පෞද්ගලීකරණය කිරීමේදී එහි සේවය කළ 3100ක් වූ සේවක සංඛ්‍යාවෙන් 1500ක පමණ පිරිසකට රැකියා අහිමි වූ බවත්;

(ii) යම් ආයතනයක් පර්ක් ආයතනය හරහා විකිණීමේදී සේවකයින්හට හිමිවිය යුතු 10% ප්‍රතිලාභයද ඔවුන්ට අහිමි වූ බවත්;

(iii) ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු තීන්දුවක් අනුව පසුගිය පාලන සමයේදී ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව නැවත රජයට පවරා ගැනීමක් සිදු වුවද, සේවය අහිමි වූ සේවකයන් සැම දෙනාම නැවත සේවයේ පිහිටුවීමක් සිදු නොවූ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) නැවත රැකියාව නොලැබීමෙන් අසාධාරණයට ලක්වූ සේවකයින්ට විසඳුමක් ලබාදීම සඳහා කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ කවර ආකාරයෙන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

199/’15

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,— නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2014 අප්‍රේල් 5 දින සිට 11 දින දක්වා කොලොම්බියාවේ පැවති ලෝක නාගරික සමුළුවට (WUF) සහභාගි වූ ශ්‍රී ලංකා (රජයේ) නියෝජිත කණ්ඩායමේ සාමාජිකයන්ගේ නම් කවරේද;

(ii) ඒ වනවිට ඔවුන් දැරූ රජයේ තනතුරු කවරේද;

(iii) එම නියෝජිත කණ්ඩායම තෝරා ගැනීමේ පදනම කවරේද;

(iv) එම සංචාරය සඳහා වියදම් කළ මුදල කොපමණද;

(v) එක් එක් අය වෙනුවෙන් දරන ලද වියදම වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම සංචාරය සඳහා පාසල් ශිෂ්‍යයෙක් සහභාගී වූයේද;

(ii) එසේ නම්, ඔහුගේ නම, පාසල සහ ඔහුගේ එවකට වයස කවරේද;

(iii) ඔහුට පමණක් එම අවස්ථාව ලබාදීමේ විශේෂත්වය කවරේද;

(iv) උක්ත සංචාරය සඳහා එම ශිෂ්‍යයා අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමතිය ලබාගත්තේ නම්, එම ලිපිය සභාගත කරන්නේද;

(v) මෙම සංචාරය සඳහා විදේශ අමාත්‍යාංශයේ අනුමතිය ලබාගත්තේ නම්, එම ලිපිය සභාගත කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම් , ඒ මන්ද?

209/’15

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා,— වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) නැගෙනහිර පළාතේ, ඔලුවිල් වරාය ඉදිකිරීම සඳහා 2008 වර්ෂයේදී රජයට පවරා ගන්නා ලද ඉඩම් වෙනුවෙන් මේ වනවිට වන්දි මුදල් ප්‍රදානය කර ඇති එක් එක් පුද්ගලයාගේ නම, ලිපිනය සහ වන්දි මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) මේ සඳහා පවරා ගන්නා ලද පුද්ගලයින් 48 දෙනෙකුට අයත්ව තිබූ අක්කර 49.5ක ඉඩමෙහි, ඉඩම් හිමියන් අතරින් මෙතෙක් වන්දි මුදල් ලබාදී නොමැති පුද්ගලයින් සඳහා ඉඩමේ වර්තමාන තක්සේරු වටිනාකම අනුව වන්දි ප්‍රදානය කිරීමට එතුමා පියවර ගන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

232/’15

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් කොළඹ 02, මෝගන් පාරේ, කිව් පොයින්ට් හි, අංක 15 හා 15 A දරන අක්කර 02යි රූඩ් 02යි පර්චස් 35ක් වන ඉඩම සමඟ ඇති වර්ග මීටර් 1600ක් පමණ වන ගොඩනැගිල්ල නීති විරෝධී ආකාරයෙන් දේශපාලන හිතවත්කම් මත රු.25,000/-ක් වැනි සුළු මුදලකට බදු දී තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උක්ත ඉඩම බදු දී ඇති ආයතනය කවරේද; ඒ සඳහා අනුමතිය ලබා දී ඇත්තේ කවුරුන්ද;

(ii) ඉහත (අ) හි සඳහන් දේපළ, කුලියට ලබා දීමේදී අනුගමනය කළ ක්‍රමවේදය කවරේද;

(iii) මාසික කුළිය තීරණය කරනු ලැබුවේ කවුරුන්ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) 2010 වර්ෂයේදී මෙම ඉඩමෙන් පර්චස් 31ක කොටසක් රු.125,000/-ක මාසික කුලියකට ලබාදී තිබූ බව දන්නේද;

(ii) එසේ නම්, 2014 වර්ෂයේදී, රු.25,000/-ක මාසික කුලියකට පර්චස් 435ක් වූ මෙම ඉඩම බදු දීමෙන්, වරාය අධිකාරියට සිදු වූ පාඩුව අයකර ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iii) මෙම මූල්‍ය වංචාව පිළිබඳව සිදු කරනු ලබන විමර්ශනයේ වර්තමාන තත්ත්වය කවරේද;

යන්න එතුමා තවදුරටත් මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

256/’15

ගරු බිමල් රත්නායක මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2010, 2011, 2012, 2013, 2014 වර්ෂයන්හීදී,

(i) ළමා අපචාර පිළිබඳ පවරා ඇති නඩු සංඛ්‍යාව වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ළමා අපචාර පිළිබඳ නඩුවලින් වරදකරුවන් බවට ඔප්පු වූ සංඛ්‍යාව වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ළමා අපචාර පිළිබඳ නඩුවලින් වරදකරුවන් බවට ඔප්පු වූ සංඛ්‍යාව, එක් එක් වර්ෂයේ පැවරූ මුළු නඩු ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

259/'15

ගරු ජයන්ත සමරවීර මහතා,— රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2015 ජනාධිපතිවරණයේදී ජනාධිපති ධූර අපේක්ෂක වර්තමාන ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා විසින් ඉදිරිපත් කල "මෛත්‍රීපාලනයක් සිය දිනකින් අලුත් රටක්" නම් වැඩසටහනේ අංක 26ට අනුව, උකස් කර ඇති රන් භාණ්ඩ සඳහා ගෙවිය යුතු අධික පොලිය හා දඩ මුදල් රුපියල් ලක්ෂ දෙකක උපරිම වටිනාකමකට යටත්ව කපා හරින බවට ලබා දුන් පොරොන්දුව අනුව පොලී හා දඩ කපා හැරීම නිසා බැංකු සඳහා නොලැබී ගිය පොලී හා දඩ මුදල් ආදායම එක් එක් බැංකුව අනුව වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

261/'15

ගරු (වෛද්‍ය) ඒ.ආර්.ඒ.හෆීස් මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) එස්. එම්. ජෙසීර් මහතා සහ ඔහුගේ පවුලේ සාමාජිකයින් මඩකලපුව, පොළොන්නරුව දුම්රිය රක්ෂිත ඉඩමේ (පූනානි, රිදීතැන්න ස්ථානයේ පිහිටි) දීර්ඝ කාලයක සිට ජීවත්වන බවත්;

(ii) එම ඉඩම් කොටස, දුම්රිය දෙපාර්තමේන්තුවෙන්, දීර්ඝ කාලීන බදු ගිවිසුමක් යටතේ ලබා ගැනීම සඳහා ඔහු අයදුම්කර තිබෙන බවත්(ලිපිගොනු අංක දු.සා./දු.ර.ක.ඒ./නව බදුදීම/2012);

එතුමා දන්නෙහිද?

(ආ) ජීවත්වීමට ස්ථිර නිවසක් හෝ ඉඩමක් නොමැතිව අසරණව සිටින ජෙසීර් මහතාට නීත්‍යානුකූල ලෙස බදු ගිවිසුමකින් දුම්රිය රක්ෂිත ඉඩමේ කොටසක් ලබාදීම කෙරෙහි සලකා බලන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

271/'15

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— ඛණිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හිටපු විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා විසින් ලෝක වෙළඳපොළෙහි ඛණිජ තෙල් මිල අනුව දේශීය වෙළඳපොළේ මිල වෙනස් වන මිල සූත්‍රයක් හඳුන්වා දෙන බව 2015 ජනවාරි 16 දින ප්‍රකාශ කළ බව දන්නේද;

(ii) මෙතෙක් එවැනි මිල සූත්‍රයක් හඳුන්වා නොදීමට හේතු කවරේද;

(iii) එවැනි මිල සූත්‍රයක් හඳුන්වා දීමට ඉදිරියේදී පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම් ඒ මන්ද?

280/'15

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මීතොටමුල්ල කුණු කන්ද ඉවත් කිරීම සඳහා පියවර ගන්නේද;

(ii) නාගරික සංවර්ධන අධිකාරිය මගින් ටෙන්ඩර් කැඳවන ලද, මීතොටමුල්ල කුණු කන්ද ප්‍රතිචක්‍රීකරණ වැඩපිළිවෙළ සඳහා අයදුම්කර ඇති අයදුම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඒ සඳහා ලබාදෙන රාජ්‍ය මැදිහත්වීම කවරේද;

(iv) මෙම ප්‍රතිචක්‍රීකරණ වැඩපිළිවෙළ ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ප්‍රතිචක්‍රීකරණ වැඩපිළිවෙළෙහි පළමු අදියර යටතේ කොළඹ නගරයේ කුණු ප්‍රතිචක්‍රීකරණය සඳහා යොමු කරන්නේද;

(ii) එසේ නම්, දෙවන අදියර ලෙස මීතොටමුල්ල කුණු කන්දේ ඇති කුණු ප්‍රතිචක්‍රීකරණය සඳහා යොමු කරන්නේද;

(iii) මෙම කුණු කන්ද නිසා පීඩාවට පත්ව සිටින කුණු කන්ද අවට ජීවත්වන සාමාන්‍ය ජනතාවට සාධාරණයක් ඉටු කිරීම සඳහා කොළඹ මහානගර සභාව සමග එක්ව වැඩපිළිවෙළක් සකස් කර තිබේද;

(iv) එසේ නම්, ඒ පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

307/'15

ගරු හේෂා විතානගේ මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සූරියවැව ක්‍රිකට් ක්‍රීඩාංගණය ඉදිකිරීම සඳහා වැයකළ මුදල කොපමණද;

(ii) එම මුදල් ලබාගත් ආකාරය කවරේද;

(iii) එහි ඉදිකිරීම් කටයුතු අවසන් කරනු ලැබූ දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වනවිට මෙහි පවත්වා ඇති අන්තර්ජාතික එක්දින, ටෙස්ට් සහ විස්සයි විස්ස තරඟ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉදිරි වර්ෂයේදී එම ක්‍රීඩාංගණයේ තරඟ පැවැත්වීමට සැලසුම්කර තිබේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම ක්‍රීඩාංගණය විවාහ මංගල උත්සව සඳහා බදු දීමක් සිදු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා දිනකට අය කරනු ලබන මුදල කොපමණද;

(iii) ඉහත (i)හි සඳහන් කරුණ සම්බන්ධයෙන් ගන්නා ඉදිරි පියවර කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

308/'15

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හෝමාගම දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගණය ඉදිකිරීම සඳහා 2009 වර්ෂයේදී වෙන් කරනු ලැබූ මුදල කොපමණද;

(ii) එම මුදල, ක්‍රීඩාංගණය ඉදිකිරීම සඳහා යොදා ගනු ලැබුවේද;

(iii) එසේ නොමැති නම්, එම මුදල් වැය කරන ලද කාරණය කවරේද;

(iv) මෙම මුදලට අමතරව ක්‍රීඩාංගණය තැනීම සඳහා විදේශ ආධාර හෝ වෙනත් දේශීය අරමුදල් ලබාගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2011 ක්‍රිකට් ලෝක කුසලානය වෙනුවෙන් ක්‍රීඩාංගණ සංවර්ධනය කිරීම සඳහා ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලයෙන් ලැබුනු මුදල කොපමණද;

(ii) බෙත්තාරාම, පල්ලෙකැලේ සහ සූරියවැව ක්‍රීඩාංගණ නවීකරණය හෝ තැනීම වෙනුවෙන් වැය කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ක්‍රීඩාංගණ නවීකරණය හෝ තැනීම් කටයුතු සිදුකළ ආයතන වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) නවීකරණය හෝ තැනීම සඳහා ගෙවන ලද මුදල එක් එක් ක්‍රීඩාංගණය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) එම නවීකරණ හෝ තැනීම් කටයුතු සිදුකළ ආයතනවලට ගෙවීමට ඇති හිඟ මුදල කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

58/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2013 හා 2014 යන වර්ෂයන්හි උතුරු මැද පළාත් සභාවේ මන්ත්‍රීවරුන් විදේශ සංචාරයන් සඳහා රජයේ වියදමින් සහභාගී වී තිබේද;

(ii) එසේ නම්, එම විදේශ සංචාර සඳහා සහභාගී වූ මන්ත්‍රීවරුන් ගණන හා ඔවුන්ගේ නම් කවරේද;

(iii) එම මන්ත්‍රීවරුන්ගේ විදේශ සංචාරයන් සඳහා පළාත් සභාව වියදම් කළ මුදල එක් එක් මන්ත්‍රීවරයාට වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) උක්ත මන්ත්‍රීවරුන් විදේශ සංචාරයන්ට සහභාගී වූ හේතු කවරේද;

(ii) එම සංචාරයන්ගෙන් රටට ලැබුණු ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මන්ත්‍රීවරුන්ට අමතරව පළාත් සභාවේ වියදමින් වෙනත් පුද්ගලයින් විදේශ සංචාරයන්ට සහභාගී වී තිබේද;

(ii) එසේ නම්, ඔවුන්ගේ නම් හා තනතුරු කවරේද;

(iii) එම පුද්ගලයින් විදේශගත වීමට හේතු කවරේද;

(iv) එයින් රටට ලැබුණු ප්‍රතිලාභ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?